# රණවිරුවා





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 23 වන යුද්ධ හමුදාධිපති ලෙස පත්වූ ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී 2019 අගෝස්තු 21 වන දින සුබ මොහොතින් සිය තනතුරේ රාජකාරි භාරගත් මොහොත.

සියක් ආයු ලැබ දිගුකල් හිඳින්නයි
පයක් පෙරට මිස පස්සට නොගන්නයි
බියක් කුමට තෙරුවන් නිති රකින්නයි
දැයක් රකින්නට සවිබල ලැබෙන්නයි

මේජර් සුජිත් චමින්ද ඒදිරිසිංහ

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, කොළඹ 03

2019 අගෝස්තු, 208 කලාපය

# ගෞරවනීය මෙහෙවරට අභිමානවත් සමුගැන්මක්



22 වන යුද්ධ හමුදාධිපති ලෙස රාජකාරී කළ ජෙනරාල් එන් යූ එම් එම් ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ජ්සීජීඑස්සී ඉකුත් අගෝස්තු 20 දින සිය තනතුරෙන් විශ්‍රාම ලැබීය. ඒ නිමිත්තෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවති අභිමානවත් උත්සවයකින් අනතුරුව නව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත සංකේතාත්මකව යෂ්ටිය පිරිනමමින් යුද්ධ හමුදාධිපති ධූරය භාරදෙනු ලැබීය.











# නව තනතුරට සුබපැතුම්





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 23 වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී නව තනතුරේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව පසුගියදා සන්නද්ධ හමුදාවන්හි සේනාධිනායක අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ද හමුවිය. ජනාධිපති ලේකම් කාර්යාලයේදී හා අරලියගහ මන්දිරයේදී සිදුවූ මෙම සුහද හමු අවසානයේ යුද්ධ හමුදාධිපතිතුමා විසින් සිය ධූරයේ රාජකාරී භාරගැනීම සංකේතවත් කරමින් ජනාධිපතිතුමා වෙත හා අගමැතිතුමා වෙත සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී.

# ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ නියෝජිතයින් හා යුද්ධ හමුදාධිපති හමුවක්



ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ උපදේශක මේජර් ජෙනරාල් උරම්කුමාරන් සුරේෂ් කුමාර් ගේ ප්‍රධානත්වයෙන් යුත් සාමාජිකයින් 16 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් එම විද්‍යාලයේ "උපාය මාර්ගික අසල්වාසි සංචාරයෙහි" එක් කොටසක් ලෙස පසුගියදා දිවයිනට පැමිණි අවස්ථාවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ.



# කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණය 2019 අභිමානවත්ව මෙවරත්





9 වන වරටත් සංවිධානය කෙරුණු ආරක්ෂක සම්මන්ත්‍රණය (**Defence Seminar**) ඉකුත් අගෝස්තු 29 සහ 30 දෙදින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. එහි ආරම්භක අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සහභාගී විය. එහිදී සම්මන්ත්‍රණයේ ආරාධිත දේශනය ආරක්ෂක ලේකම් ජෙනරාල් ශාන්ත කෝට්ටේගොඩ විසින් සිදුකළ අතර, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් පිළිගැනීමේ දේශනය සිදුකරන ලදී. මෙම සම්මන්ත්‍රණය සඳහා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විදේශීය රටවල ආරක්ෂක අංශ නිලධාරීන් ඇතුලු විශාල පිරිසක් සහභාගී වූහ.





# සුබ මොහොතින් රාජකාරී අරඹයි...

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 54 වැනි මාණ්ඩලික ප්‍රධාන ලෙස මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී 2019 අගෝස්තු මස 27 වන දින සුබ මොහොතින් රාජකාරී අරඹණු ලැබීය. ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කර්නල් සේනාවිධායක ධූරයද හොබවන මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී මාණ්ඩලික ප්‍රධාන තනතුරට පත්වන අවස්ථාව වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයේ ආඥාපති ධූරය ද දරණ ලදී. රණබිමෙහිද බොහෝ අත්දැකීම් සපිරි දක්ෂ නිලධාරියෙකු වූ එතුමන්ට රණවිරුවා තුළින්ද මෙසේ සුබපැතුම් එක්කරයි.



# මව් ඒකකයේ සංචාරයක නිතර වෙමින්

හිටපු යුද්ධ හමුදාධිපතිවරයෙකු මෙන්ම පාබල හමුදා රෙජිමේන්තු අධිපතිවරයෙකු ලෙසද රාජකාරී කළ වත්මන් ආරක්ෂක ලේකම් ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ ඉකුත් ජූලි මස 27 දින තම මව් රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය. එහිදී ආරක්ෂක ලේකම් තුමන් යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව වර්ණ ධජ සහිත අභිමානවත් සම්මාන පෙළපාලියකින් පිදුම් ලැබූ අතර, එහිදී ඔහු පාබල හමුදා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වා දේශයේ නිදහස වෙනුවෙන් කායදානය කැප කරන ලද අභීත රණවිරුවන් වෙනුවෙන් තම කෘතවේදීත්වය පිරිනැමීමටද අමතක නොකළේය.

තවද එදින රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී සුහද හමුවක්ද පැවති අතර, ඊට ආරක්ෂක ලේකම් තුමා සහ සෝනියා කෝට්ටේගොඩ මහත්මියද එක්වූහ. තවද එම අවස්ථාවට වත්මන් පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය ක්‍රිෂානි මුදලිගේ මහත්මිය ඇතුලු විශාල පිරිසක් ද සහභාගි වූහ.









# සිය මතකයන් අවධි කරමින් මිහිඳුසෙත් මැදුරේ සංචාරයක





යුද බිමේදී තිබූ සහෝදර සබඳතා සිහිපත් කරමින් නව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිණී සුජීවා නෙල්සන් මහත්මිය පසුගියදා රණකෂිතයට පත්ව අත්තිඩිය මිහිඳු සෙත්මැදුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් බැලීමේ නිරත වූහ. මෙම සංචාරය අතරතුර එහි රණවිරුවන් ඔවුන්ගේ සෞන්දර්යාත්මක කුසලතා පෙන්නුම් කරමින් රැඟුම් ගැයුම්වලින් එම අවස්ථාව විචිත්‍රවත් කරන ලදී. තවද එහි ප්‍රතිකාර ලබන රණවිරුවෙකු එම අවස්ථාවේදීම සිතුවමක් ඇඳ එය සිහිවටනයක් ලෙස යුද්ධ හමුදාධිපතිතුමා වෙත පිළිගැන්වීමද විශේෂත්වයකි.











# ගෞරවනීය සම්ප්‍රාප්තියට මව් රෙජිමේන්තුවෙන් බුහුමන්







ගජබා රෙජිමේන්තු ඉතිහාසයේ පළමු යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සිය ධූරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් අගෝස්තු 31 දින සාලියපුර පිහිටි එම රෙජිමේන්තු මූලස්ථානයේ සංචාරයක නිතරවිය. එහිදී ගජබා රෙජිමේන්තුවට අභිමානයක් අත්කර දුන් නව යුද්ධ හමුදාධිපති වෙනුවෙන් සිය රෙජිමේන්තුවෙන් හිමිවූයේ උණුසුම් පිළිගැනීමකි. ප්‍රවීණයන්, ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිලධාරීන්, සම්භාවනීය ආරාධිතයින් සහ සෙසුනිලයින් රැසක් එක්වූ එම විචිත්‍ර මොහොත ගජබා රෙජිමේන්තුවේ එදාමෙදාතුර ගමන්මගෙහි සුවිශේෂී සන්ධිස්ථානයකි.



# අභිමන් මෙහෙයට උත්තම පිදුමක්

## විශේෂ බළකාය
## රණ පරශුව සම්මානයෙන් පිදුම් ලබයි





අප රටෙහි ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් සිදුකරන ලද අභීත මෙහෙවර උදෙසා විශේෂ බළකා රෙජිමේන්තුව පසුගියදා ජනාධිපති "රණ පරශුව" සම්මානයෙන් පිදුම් ලැබීය. ඒ නිමිත්තෙන් සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගේ ප්‍රධානත්වයෙන් වූ අභිමානවත් උත්සවය නාඋල පිහිටි විශේෂ බළකා රෙජිමේන්තු මූලස්ථානයේදී පසුගියදා පැවැත්විණ. එහිදී වීරෝදාර රණවිරුවන් තම රෙජිමේන්තුවට සහ පවතින රජයට පක්ෂපාතී බවට දිවුරුම් දෙන විශිෂ්ඨ ලාංඡනයක් වන මෙම "ජනාධිපති රණ පරශුව" සහ "රෙජිමේන්තු රණ පරශුව" පිළිගැන්වීම යුද්ධ හමුදා ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සටහන්වීමකි. විශේෂ බළකා රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී පැමිණ සිටි පිරිස ඉදිරියේ "රණ පරශුව" වෙත ගෞරව කරමින් තම පක්ෂපාතීත්වය පුදකරන ලදී. ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ආරාධිතයින් විශේෂ බළකා ඉතිහාසයේ කිසිදිනයක නොතිබූ මෙම "රණ පරශුව" ප්‍රදානය කරනු ලැබූ උත්සවය නැරඹීම සඳහා පැමිණ සිටියහ.











# හටකාර්ය සම්පාදන විද්‍යාලයේ උපාධි සහතිකපත් ප්‍රදානය යුද්ධ හමුදාධිපතිගේ සුරතින්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 23 වන යුද්ධ හමුදාධිපති ලෙස අභිනවයෙන් රාජකාරී භාරගත් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සිය ධූරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ප්‍රථමයෙන් ඉකුත් අගෝස්තු 22 වන දින කොළඹ ආරක්ෂක සේවා විද්‍යාල ශ්‍රවණාගාරයේ පැවති හටකාර්ය සම්පාදන විද්‍යාලයේ උපාධි සහතිකපත් ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. හටකාර්ය සම්පාදන විද්‍යාලයේ පාඨමාලා අංක - 05 සාර්ථකව හැදෑරූ ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරියෙකු, ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරියෙකු, බංගලාදේශය, පකිස්තානය, සිම්බාබ්වේ සහ මාලදිවයින යන රටවල් නියෝජනය කරමින් විදේශීය හමුදා නිලධාරීන් 04 දෙනෙකු ඇතුලු ශිෂ්‍ය නිලධාරීන් 36 දෙනෙක් මෙම සහතිකපත් ප්‍රදානෝත්සවයේදී විසිර ගියහ. එම පාඨමාලාවේ "හොඳම ශිෂ්‍යයා" ලෙස ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ මේජර් එන්ඩීයූඅයිඩී ද සිල්වා තේරී පත්වූ අතර පාඨමාලාවේ හොඳම "හටකාර්ය සම්පාදන සැලසුම්කරු" වූයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකායේ මේජර් එම්පී සිරිවර්ධනය.



මෙම අවස්ථාව සඳහා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති, ආරක්ෂක අංශ ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ නිලධාරීන් සහ සම්භාවනීය අමුත්තන් රැසක් ද සහභාගී වූහ.



# සිතුවිලි සාගරය

## විරු සැමරුම එදා සහ අද

යුද ගිනි නිවා සාමයෙ මල් පිබිදේවා
එදස පැතුම් සැම සිත් තුළ ඇතිවූවා
තැන තැන පහන් නිති සැම විට දැල්වූවා
යුද බිය දැනුන විට විරුවන් සිහිවූවා

රට රැකි විරුවො සැම නිති දෙවිවරු වූවා
පන්සල් පල්ලි කොවිල් වල සෙත් පැතුවා
මියගිය විරුවො වෙනුවෙන් නිති පිං පිදුවා
ඒ අය හැදූ මව්පියො දෙවිවරු වූවා

එල්ලා කඩා වැටි පිළිරුව සතර අත
නිතරම වගේ මාවත් වල දකිනු ඇත
කළ මෙහෙවරට තුතිමල් අද පුදනු නැත
අරුමය කිමද සිහලුන් හට මතක නැත

එදවස විරු මවුන් දෙවිවරු දකිනු නැත
රණවිරු පුතුන් අද දෙකකුල් නැතිව ඇත
යන එන විටදි මහමග නිති දකිනු ඇත
නිහඬව සිටිති ගමනෙදි කිසි සරණ නැත

යුද ගිනි නිවා සාමයෙ මල් පුබුදන්න
නුඹ උරදුන්න හැටි හිත තුළ සිහිවන්න
ශක්තිය වඩා තනි කකුලෙන් නැගිටින්න
සිතපත් පුතේ යළි මේ රට රැකගන්න

*මේජර් කේකේඒ එස් කුමාර ශ්‍රීලංජාආබමු*
*ප්‍රමාති 11 (මව්මෙ අංශය)*
*ආසේමු (වන්නි)*

## උදාවේද සුභ දිනක්

ගම් දනව් සිසාරා ගලායන
මත් රකුසා...
සිරිලක් දෙරණම වසාගයි
ඇද දමයි බැඳි සිත්...
ලොවපුරා දිදුලයි
සිරිලක් නාමය
මතට මුල්තැන දෙමින් ත්‍රස්තය...
සිදුවූයේ කුමක්ද...
නුඹ නගයි ඉකිගසා දෝංකාර
රට මැද්දේ...
පර සතුන් රජවෙලා
වියැකෙමින් බුදු දහම...
දෙතිස් පෑ රජවරුන්
උරුම කළ ශ්‍රී ලකඹර
බක්මහේ අසිරියත් නැති වුනා
හදවතින්...
බියවුනා අඳුරට කුරිරු රුදු
මිනිසුන්ට...
නැවත වරක් එසේවිලා...
අවි රැගත් දෙවිවරුන්....
උදාවේද සුබ දිනක් මල්බර
දෙරණට මගේ...

*සෙ/379339*
*රසෙ රත්නායක ආර්එම්එන්කේ*
*යුද්ධ හමුදා විද්‍යා පීඨය*
*දියතලාව*

## අවසාන පාසල් කාලය

කෙළිලොල් පාසල් කාලයට
තවත් ඇත්තේ වසරකි
කෙළි කවටකම්
රණ්ඩු සරුවල් මැද්දේ
පන්ති කට් කරලා පැනපු
බජව් දාපු සෙට් එකේ
සුන්දර මතක අරගෙනයි
නික්මෙන්නට ඇත්තේ
කෙසේ දුක දරා ගන්නද
එහෙත් ඉවසමි,
හඬනෙමි,
සිනාසෙමි
මන්ද යත්
එයයි තිත්ත වුණත් ඇත්ත

*ඩබ්ලිව්එස් ලියනගේ*
*13 බී කලා (2020)*
*89/2 නඩුදෙණිය පාර*
*පන්නිපිටිය*

## ජීවිතේ සුන්දරයි

කාලය ගෙවී ගිය අරුමය
ගෙවී ගිය ඒ සුන්දර අතීතයට
ආයෙත් යන්න ඇත්නම්
පාසල් මිතුරු මිතුරියන් එක්ක
අඹ ගස් සෙවණට වී මොහොතක්
ඉන්න ඇත්නම්
මේ හඬා වැළපෙන සිතට
සුවයක් දැනෙයි නිසැකවම....
කාලය ගෙවී ගිය අරුමය
දැනෙන විට නිතර නිතර
සත්තයි කඳුලු එනවා නෙතට
තාත්තාගේ තුරුලට වෙලා
සුව නින්දක් යන්නේ කවදාද....
හරිහමන් නොතේරෙන ඒ කාලය
හැමදේම තේරෙන වර්තමානයට වඩා
පුදුම තරම් සුන්දරයි
ජීවිතේ ලස්සනම කාලයයි....

*සෙ/කියු104364 සාසෙ බංඩාර කේඑම්ඒඑච්*
*9 ශ්‍රීලංජාආබමු*
*යුද හමුදා කඳවුර*
*ශිවනගර්*
*පුදුකුඩුඉරිප්පු - මුලතිවු*

## මතක සටහන්

කෑලි කපන ගණදුර ඒ අමාවක රෑ
අප සිව්දෙන මුර කුටියක රාජකාරි රෑ
සද්ද බද්ද නොකර ගතකළ ඒ රෑ
බකුසු සිවල් නාද සතර වටින් ඇසුණු රෑ

එක වරටම ආ සද්දෙන් එළිය වැටුණ රෑ
වැලි කොට්ටා වලට උණ්ඩ වැදී දිලුණ රෑ
බංකරයේ හැම තැනකම දෙදරුම් කෑ රෑ
ප්‍රතිප්‍රහාර වලට යමින් සටන් කෙරුව රෑ

අප අතරට වැටුණු යමක් පුපුරා ගිය රෑ
එකෙක් වැටුණි අනෙකා හට තුවාල වුණ රෑ
අප දෙදෙනා එකට සටන් කරන් ගියා රෑ
අන්තිමේදී මා ඉතිරිව ඔහුද ගියා රෑ

අදත් අමාවකේ දිනට ගෙදර ඉන්න රෑ
එදා දවස මතක් වෙනව මිතුරන් ගිය රෑ
අරන් ගියා මගෙ කකුලත් ඒ මූසල රෑ
උන් තිදෙනා අරන් ගිහින් මා තනිකළ රෑ

*ජනක මල්ලවආරච්චි*
*නියෝජ්‍ය විදුහල්පති*
*කිරිල්ලවල මධ්‍ය මහා විද්‍යාලය*
*කඩවත*

## සත්‍යවාදියෙකුගේ මළගම

තැනින් තැන කරගැට නැගී
දුර්වර්ණව ඉරි තැලුණු
මිනිසත් කම පෙරටු කොට
ලෝකයේ සැනසුමට
වැඩ කෙරුව නුඹෙ දෑත්
එකට බැඳ ගියා නුඹ
ආයෙත් මෙහෙ
නොඑන ගමන්...
නැත මල ගෙදර මිනිසුන්
නැත කොඩි වැල් දුක් ගී
හැඩුම් වැලපුම්
මා දනිමි නුඹෙ සිතෙහි
තිබුනා බොහො දේ
පුහුදුන් ලෝකයට
කිව්වාට වැඩක් නැති

*එච්පීකේ කුසුම්සිරි යූඑස්පී*
*විශ්‍රාමික - 6 ශ්‍රීලකාහ*
*බොරලුවතොට*
*නීතිදාන*
*අම්බලන්ගොඩ*





# සුබ මොහොතින් වැඩ භාරගනිමින්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 15 වන ගරු සභාපතිණිය ලෙස සුජීවා නෙල්සන් මහත්මිය ඉකුත් අගෝස්තු මස 29 දින සුබ මොහොතින් වැඩ භාරගන්නා ලදී. එහිදී එම අවස්ථාවට එක්වූ පිරිස සමඟ තේ පැන් සංග්‍රහයකටද සහභාගී වූ එතුමිය සෙසු සේවා වනිතා ශාඛාවන්හි සභාපතිණියන් සමඟ සමූහ ඡායාරූපයකට ද පෙනී සිටින ලදී.

# ගාල්ල විරු කැකුළු පෙර පාසල





විරු කැකුළු පෙර පාසල් දරුදැරියන්ගේ දෙවන වාරයට නියමිත වාර්ෂික සිගිති පොළ 14(සෙව්) ගැහේබ සරඹ භූමියේදී පසුගියදා පැවැත්විණ. එම පොළ විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 58 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී එක්විය.

# පල්ලෙකැලේ විරු කැකුළු පෙර පාසල





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් පවත්වාගෙන යනු ලබන පල්ලෙකැලේ විරු කැකුළු පෙර පාසලෙහි වාර්ෂික සිගිති පොළ ඉකුත් ජූලි මස 23 දින එම පෙර පාසල් භූමියේදී පැවැත්විණි. දෙමාපියන් ඇතුලු විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් උත්කර්ෂවත් ලෙස පවත්වන ලද එම සිගිති පොළ විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 11 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ජ්එස් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ එක්විය.





## සංඥා බළකා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ මාසික සභා රැස්වීම ඉකුත් ජුනි 23 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එම අවස්ථාවට සමගාමීව "ආකල්ප සංවර්ධනය තුළින් යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගැනීම" මැයෙන් වූ දේශනයක් යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති යන නිලධාරිණිය විසින් පවත්වන ලදී. තවද ඒදින මෙම රෙජිමේන්තුව යටතේ රාජකාරි කරනු ලබන කෝප්‍රල් කපිලරත්න ඩබ්ලිව්එම්එස්ආර් යන කොනොනිගේ පුතනුවන් හට ශිෂ්‍යාධාර පිරිනැමීමක්ද සිදුකෙරුණු අතර, ඒ සඳහා 2/ලුතිනන් යූඅයිඑන්ඩබී ජාගොඩගේ සහ කෙඩෙට් නිලධාරිණී ජේඑම්එල්අයි ජයසුන්දර යන නිලධාරිණියන් දායකත්වය ලබාදෙන ලදී. තවද සේවයේ නිරතව සිටියදී මියගිය සැරයන් බණ්ඩාර කේජ්එස්පී යන ජේ්‍යකොනොනිගේ යැපෙන්නන් හට සංඥා බළකා සේවා වනිතා ශාඛාව මගින් ඉදිකරමින් පවතින නව නිවසට අවශ්‍ය නාන කාමර කට්ටලයක් පිරිනැමීමද එම ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක් වන දිශාණි මෙන්ඩිස් මැතිණිය විසින් සිදුකරන ලදී.




## පාබල හමුදා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ මහාසභා රැස්වීම ගරු සභාපතිණි ක්‍රිෂානි මුදලිගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2019 ජූලි 28 දින රෙම ශ්‍රීලපාහ දේශන ශාලාවේදී පැවැත්විණ. එහිදී මියගිය, රණඝිතයට පත් සහ සේවයේ යෙදී සිටින නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල ළඟම ඥාතීන් වෙනුවෙන් ඉදිරියේදී සුබසාධන කටයුතු සිදුකිරීම සබැඳිව විශේෂයෙන් සාකච්ඡා කරන ලදී.




## ඉංජිනේරු සේවා බළකා සේවා වනිතා ශාඛාව

ඉංජිනේරු සේවා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ලෙස කටයුතු කළ සාගරා ගුණවර්ධන මහත්මිය 2019 අගෝස්තු 10 දින එම තනතුර අත්හල අතර, වෛද්‍ය නිරෝෂණී ගනේගොඩ මහත්මිය නව සභාපතිණිය ලෙස වැඩ භාර ගන්නා ලදී. මේ වෙනුවෙන් පැවති උත්සවය ඉසේබ නිලධාරී නිවස්නයේ පැවති අතර, එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් විශාල පිරිසක් මේ සඳහා එක්වූහ.





# සේවා බළකා සේවා වනිතා ශාඛාව

රෙම ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකා සේවා වනිතා ශාඛාවේ මැදිහත්වීමෙන් 9 (සේවා) ශ්‍රීලයුසේබ හා ස්වාධීන සැපයුම් ගබඩාව එක්ව සංවිධානය කළ වෛද්‍ය වැඩමුලුවක් 2019 ජූලි 27 දින කරාපිටිය ශික්ෂණ රෝහල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට සේවා බළකා නිලධාරීන්, සෙසුනිලයින් හා ඔවුන්ගේ භාර්යාවන් රැසක්ද සහභාගී වූහ.

# වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාව





වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාව මගින් පොසොන් පොහොය නිමිත්තෙන් සංවිධානය කරනු ලැබූ සුමදුර ධර්ම දේශනාවක් කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ නිර්මාතෘ පූජ්‍යපාද දියසෙන්පුර විමල ස්වාමීන් වහන්සේගේ මෙහෙයවීමෙන් 2019 ජූනි මස 16 දින කොළඹ යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම ධර්ම දේශනාව යුද්ධ හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සියලු දෙනාට ශ්‍රවණය කිරීමේ අවස්ථාව සලසාදීමද විශේෂත්වයකි.

මෙම අවස්ථාව සඳහා වෛද්‍ය බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එස්එච් මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී, එම සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය බ්‍රිගේඩියර් ඩීටීඑන් මුණසිංහ යූඑස්පී, වෛද්‍ය බළකා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීජී හේවගේ ආර්එස්පී, කොළඹ යුද්ධ හමුදා රෝහල් අධ්‍යක්ෂක කර්නල් කේපීඑන් පතිරණ ඇතුලු වෛද්‍ය බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ නිලධාරිණියන් රැසක් සමග සෙබළ සෙබළියෝ 400 ක් පමණ සහභාගී වූහ.

# පොදුසේවා බළකා සේවා වනිතා ශාඛාව

යුද්ධ හමුදා පොදුසේවා බළකා සේවා වනිතා ශාඛාව ජාතික රුධිර පාරවිලනය මධ්‍යස්ථානය සමඟ සම්බන්ධතාවයෙන් ඉකුත් අගෝස්තු මස 22 දින ශ්‍රීලයුපොදුසේබ දේශන ශාලාවේදී ලේ දන්දීමේ කඳවුරක් පවත්වන ලදී. එම පුණ්‍ය කටයුත්ත සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය වශයෙන් පොදුසේවා බළකා සේවා වනිතා ශාඛා සභාපතිණිය දීපා හඳුන්මුල්ල මහත්මිය සහභාගි විය. එම වැඩසටහන 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකා අණදෙන නිලධාරී ඇතුලු ඒකක කාර්යය මණ්ඩලයේ සංවිධානයෙන් පැවැත්වූ අතර, යුද්ධ හමුදා සාමාජිකයින් 160 කට අධික පිරිසක් එදින රුධිරය පරිත්‍යාග කරනු ලැබූහ.










## සංගීත කාමරේ

**ටීචර්** - ළමයි... දැන් බලන්න අපි සංගීත ඉගෙනගන්නකොට එක එක විදියෙ සංගීත භාණ්ඩ ගැන අපිට ඉගෙනගන්ඩ වෙනවා... තරිඳු පුතා කියන්න බලන්න ඔයා කැමතිම සංගීත භාණ්ඩය මොකද්ද කියලා?

**තරිඳු** - ඉන්ටර්වල් එකට ගහන බෙල් එක ටීචර්...



## පෙමින් වෙලීම...



**කමල්** - නංගී... ඔයා මට කොච්චරක් ආදරේද?

**නයනි** - මගෙ පනටත් වඩා අයියේ...

**කමල්** - එහෙනම් මගෙ බෙල්ල අතාරිනවද... මගෙ හුස්ම හිරවෙලා මැරෙන්න කලින්...

## මාමයි බෑනයි

කොල්ලෙක් යාලු කෙල්ලගෙ ගෙදර ගිහින් කෙල්ලගෙ තාත්ත හම්බුණාලු

**මාමා** - ආ... පුතා වාඩිවෙන්න...

**චරිත්** - තෑන්ක් යූ අංකල්...

**මාමා** - පුතා අරක්කු, සිගරට් එහෙම පාවිච්චි කරනවද?

**චරිත්** - අංකල් ප්‍රශ්නයක්ද ඇහුවෙ? නැත්තං ආරාධනාවක්ද කළේ?



## මගෙ පන

**සර්** - ළමයි... අපි මැරුණම පණ යන්නෙ කොහෙන්ද?

**සුනිල්** - සර්... ජනේලයෙන්...

**සර්** - ඊ කොහොමද සුනිල් එහෙම කියන්නේ...

**සුනිල්** - නෑ සර්... දවසක් රෑ අපෙ අක්ක කියනව ඇහුන "ජනේලයෙන් පැනල යන්න මගෙ පන.." කියල...

## අවනම්බුව...

කසුන් හෝටලේකට ගිහින් කාල බිලත් ගෙවල වේටර්ට රුපියල් 10 ක් දුන්නලු...

**වේටර්** - චීකේ මහත්තයා... රුපියල් 10 ක්... මේක මට කරන ලොකු අවනම්බුවක්...

**කසුන්** - ඇයි දැන් මොකක්ද ප්‍රශ්නෙ...

**වේටර්** -රුපියල් 20 ක්වත් දෙන්ඩකො...

**කසුන්** - මට තමුසෙට දෙපාරක් අවනම්බු කරන්න ඕන නෑ අයිසෙ... ඔන්න ඔය රුපියල් 10 ත් දෙනව මෙහාට...

## ගෙදර නෝනා...

යාලුවො දෙන්නෙක් බොනවලු

**සඳරුවන්** - මට නම් ඉක්මනට ගෙදර යන්ඩ ඕන බං...

**වරුණ** - මොකක්ද යකෝ... උඹල ගෑණුන්ට මාර බයක්නෙ තියෙන්නෙ...


**සඳරුවන්** - බය නෙමෙයි බං... කනක් ඇහිල නිදාගන්ඩ නෑ...

**වරුණ** - බලපංකො ඒකට අපේ ගෑණු... මං කොච්චර බීල ගියත් කටක් හොල්ලන්නෙ නෑ...

**සඳරුවන්** - උඹලට වගේ හොඳ ගෑණු හැමෝටම සෙට් වෙන්නෙ නෑ මචං...

**වරුණ** - උඹත් මං වගේ අනාගතේ ගැන හිතල

## හක්කෙ දත්



**සුපුන්** - හිරූ... ඇයි අනේ හක්කෙ දත් පස්සෙ එන්නේ? ඉන්න බෑ රිදෙනවා... අමාරුයි

**හිරු** - මගෙ නම් හක්කෙ දත් එන්නෙ කටේ... ඔයාගෙ විතරක් වෙන

# අභීත විරුවන් සමරමින්

රට දැය වෙනුවෙන් දිවිපිදූ ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ඇතුලු විරුවන් දසදෙනෙකුගේ 27 වන වර්ෂ පූර්ණ අනුස්මරණ දිනය ඉකුත් අගෝස්තු මස 08 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් යාපනය අරාලි තුඩුවේ පිහිටි ස්මාරකය අභියස පුෂ්පෝපහාර දැක්වීමේ උත්සවයක් යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ජ්සීජීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එහිදී මේජර් ජෙනරාල් විජය විමලරත්න, රියාද් අද්මිරාල් මොහාන් ජයමහ, කර්නල් එච්පී ස්ටීවන්, කර්නල් වයිඑන් පලිපාන, කර්නල් ජීඑච් ආරියරත්න, ලුතිනන් කර්නල් නලීන් ද අල්විස්, ලුතිනන් කමාන්ඩර් අසංග ලංකාතිලක, ලුතිනන් කමාන්ඩර් සීබීවී විජේපුර යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ කෝප්‍රල් වික්‍රමරත්න ඩබ්ලිව්ජේ යන විරුවන් වෙනුවෙන් පුෂ්පෝපහාර පුදනු ලැබීය. මෙම අවස්ථාව සඳහා 52 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්එස් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් ද සහභාගී වූහ.









# විරු දෑතින් නව නිවසක්

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ජ්සීජීඑස්සී ගේ අදහසකට අනුව ප්‍රවීන ගායන ශිල්පී භාතිය ජයකොඩි සහ චින්තක සොයිසා යන මහත්වරුන්ගේ ධන පරිත්‍යාගයෙන් කොඩිකාමම් (උතුර) ග්‍රාම සේවා වසමේ පදිංචි අඩු ආදායම්ලාභී දිළිඳු පවුලක් වෙත නව නිවසක් ඉදිකර එම නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ ද සමගින් නිවෙස් හිමියන් සතු කිරීමේ උත්සවයක් ඉකුත් අගෝස්තු මස 04 දින පැවැත්විණ.

යාපනය ආරක්ෂක සේනා ආඥාපති ගේ ප්‍රධානත්වයෙන් පැවති එම උත්සවය සඳහා 52 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්එස් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, ගායන ශිල්පී භාතිය ජයකොඩි හා චින්තක සොයිසා, යුද්ධ හමුදා නිලධාරීන්, සෙසුනිලයින් ඇතුලු ප්‍රදේශවාසීන් විශාල පිරිසක් සහභාගී වූහ. 522 බළසේනා මූලස්ථානයේ අධීක්ෂණයෙන් 15 (සෙව්) ගජබා රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් මෙම නිවස ඉදිකෙරිණ.






# තාක්‍ෂණයේ නව මං සොයා

ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ රාජකාරි කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ තාක්‍ෂණික දැනුම නැංවීමේ අරමුණින් "තාක්‍ෂණයේ නව මං සොයා" නමින් නව නිපැයුම් ප්‍රදර්ශනයක් ඉකුත් ජූලි මස 26 හා 27 දෙදින පුරා පදවි පරාක්‍රම පුර මහජන ක්‍රීඩාංගනයේදී පැවැත්විණි. ඒ සඳහා 21, 54 ,56, 61, හා 62 සේනාංක යටතේ මෙන්ම ඉනපෙ (උ/මැ) යටතේ පාලනය වන ඒකක 36 ක යුද්ධ හමුදා සාමාජිකයින් ඔවුන්ගේ නව නිපැයුම් ඉදිරිපත් කර තිබිණි. එහිදී සුලං බල විදුලි උත්පාදන යන්ත්‍රයක් නිපදවූ සෙ/7 එස් 00375 ලා/කෝ වීරසිංහ කේඩී ප්‍රථම ස්ථානය හිමිකරගත් අතර, වේගවත් සංඥා පද්ධතියක් නිපදවූ සෙ/15 එස් 00740 ලා/කෝ ජයතිලක යූජීඩබ්ලිව්ඩබ්ලිව් එහි දෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී. එසේම තරඟයේ තෙවන ස්ථානය ස්වයංක්‍රිය වාහන පරීක්ෂණ යන්ත්‍රයක් නිපදවූ සෙ/14 ඩී01097 ලාකො රත්නසිරි එම්ජීපීකේ දිනා ගැනීමට සමත් විය. එම ප්‍රදර්ශනයේ සමාරම්භක අවස්ථාවට අරාධිත අමුත්තා වශයෙන් වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.







# මානසික සුවයට භාවනා වැඩසටහනක්

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ රාජකාරි කරන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ කායික හා මානසික වර්ධනය උදෙසා ලක්විරු අධ්‍යාත්මික සුවතා එක්දින භාවනා වැඩසටහන ඉකුත් ජූලි 31 වන දින දවසපුරා ආසේමූ (වන්නි) ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. පූජ්‍ය දියසෙන්පුර විමල ස්වාමින් වහන්සේ විසින් මෙහෙයවනු ලැබූ එම භාවනා වැඩසටහන සඳහා සෙබළ සෙබළියෝ 100 දෙනෙකුට වැඩි පිරිසක් සහභාගි වූහ. මෙම වැඩසටහන යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂක මණ්ඩලයේ අධීක්‍ෂණය යටතේ සිදුකෙරෙන්නකි.



# ධාතූන් වහන්සේ තැන්පත් කිරීම ආඥාපති සුරතින්



නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථාන පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරන ලද ස්තූපයේ ප්‍රජනීය ධාතූන් වහන්සේලා තැන්පත් කිරීමේ විශේෂ ආගමික උත්සවයක් ඉකුත් අගෝස්තු මස 01 දින පැවැත්විණි. මහා සංඝ රත්නයේ අනුශාසනා මත ස්ථූපය ඉදිකිරීමේ පුරෝගාමියා වූ නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේපීජ් ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් සාදුකාර මධ්‍යයේ එම ස්තූපයේ ධාතූන් වහන්සේ තැන්පත් කරන ලදී. මෙම ස්තූපය නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ වීරෝදාර රණවිරුවන් විසින් ඉදිකරන ලද්දේ ත්‍රස්තවාදය පරාජය කොට, රටට සාමය ගෙන ඒමේ උදාර සේවය අගය කිරීමේ සංකේතයක් ලෙසය. වැලිකන්ද බෞද්ධ මධ්‍යස්ථානයේ සිට වර්ණවත් පෙරහැරකින් ධාතූන් වහන්සේ නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථාන පරිශ්‍රය වෙත වැඩම කරවනු ලැබූ අතර, මෙම ධාතූන් වහන්සේ තැන්පත් කිරීමේ අවස්ථාවට යුද්ධ හමුදා සාමාජිකයින් විශාල පිරිසක් ද එක්ව සිටියහ.







# විරු දෑතින් නව නිපැයුම් බිහිවෙයි




නැගෙනහිර ප්‍රදේශයේ රාජකාරියෙහි නියුතු සොල්දාදුවන් දිරිගැන්වීමේ අරමුණින් සංවිධානය කෙරුණු නවෝත්පාදන නිර්මාණයන් එළි දැක්වීමේ ප්‍රදර්ශනයක් ඉකුත් අගෝස්තු මස 09 දින පොළොන්නරුවේ පිහිටි පුලතිසි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී පැවැත්විණ. නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේපීජ් ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම මත සංවිධානය කෙරුණු එම තරඟාවලිය සඳහා නවෝත්පාදන නිර්මාණ 100 කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබිණ. මෙම ප්‍රදර්ශනනය ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් අයිඕඩබ්ලිව් මාදොල විසින් විවෘත කරනු ලැබූ අතර, එම සමාරම්භක අවස්ථාවට 24 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒඅයි මාරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුලු විශාල පිරිසක්ද සහභාගී වූහ.

# අභීත රණවිරු හසලක ගාමිණී ගේ ගුණ සැමරේ

සහෝදර සෙබලුන්ගේ ජීවිත රැකගැනීමේ ඒකායන අරමුණ වෙනුවෙන් තම ජීවිතය පුදකොට ඉතිහාසයට නම එක්කළ අභීත රණවිරු ගාමිණී කුලරත්න (හසලක ගාමිණී) විරුවාගේ 28 වැනි ගුණ සැමරුම ඉකුත් ජූලි මස 13 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කළ සැමරුම් වැඩසටහනක් කිළිනොච්චි ආරක්ෂක ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී ගේ ප්‍රධානත්වයෙන් හසලක ගාමිණී කුලරත්න රණවිරු ස්මාරකය අභියසදී පවත්වන ලදී. එහිදී මහා සංඝරත්නය වැඩමවා සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පවත්වා උදෑසන හීල් දානය සහ පිරිකර පූජා කිරීමෙන් අනතුරුව ස්මාරකයට පුෂ්පෝපහාර දක්වන ලදී. මෙම උත්සවය ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චි) ආඥාපතිගේ මඟපෙන්වීම මත 66 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්ඩී විජේසුන්දර ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් 662 බළසේනාධිපති කර්නල් පීආර් පතිරවිතාන පීඑස්සී ගේ සංවිධායකත්වයෙන් පවත්වනු ලැබීය.





# "පාද යාත්‍රා" බැතිමතුන්ට යුද්ධ හමුදාවෙන් සත්කාර





කිළිනොච්චිය ප්‍රදේශය හරහා පාද යාත්‍රාවේ යෙදෙන බැතිමතුන්ට සත්කාර කිරීමට යුද්ධ හමුදාව පෙරමුණ ගෙන ඇත. ඒ අනුව 19 ශ්‍රී ලංකා පාබල හමුදාවේ හා 11 ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් එක්ව මුලංකාවිල්හි මහා පල්ලියේදී බැතිමතුන් හට සිසිල් පැන් ලබාදීමටත්, 651 බළසේනාවේ භටපිරිස් විසින් මඩු පල්ලිය දෙසට ගමන් ගන්නා බැතිමතුන්ට පලිආරු පාලම අසලදී පානීය ජලය ලබාදීමටත් කටයුතු කරන ලදී. කිළිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී ගේ අධීක්ෂණය මත මෙම සත්කාරය සිදුකෙරේ.

# රණවිරුවන්ගේ කලා හැකියාවන් එළිදකී



මුලතිව් ආරක්ෂක සේනා ආඥාපතිගේ උපදෙස් මත ඒ යටතේ පාලනය වන සේනාංක, ඉනපෙ, බසේමු හා ඒකකයන්හි රාජකාරී කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීමේ අරමුණින් සහ ඔවුන්ගේ කලා කුසලතාවයන් එළිදක්වීමට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සංවිධානය කෙරුණු අන්තර් ඒකක නාට්‍ය තරඟාවලියක් පසුගියදා පැවැත්විණ.

එහි අවසන් තරඟය ඉකුත් අගෝස්තු 27 දින මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ඒඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 64 වන සේනාංක දේශන ශාලාවේදී පවත්වනු ලැබීය. අවසන් මහා තරඟය සඳහා ඉදිරිපත් වූ නාට්‍ය කණ්ඩායම් දෙක අතුරින් 17(සෙව්) ගජබා රෙජිමේන්තු කණ්ඩායමට ප්‍රථම ස්ථානයද, 7 වන ගැමුණු හේවා බළකා කණ්ඩායමට දෙවන ස්ථානයද හිමිවූහ. තරඟාවලියට සහභාගී වූ සියලු හමුදා සාමාජිකයින්ට සිය සහජ හැකියාවන් එළිදැක්වීමට එය කදිම පිටුවහලක් විය.



ජයග්‍රාහී කණ්ඩායම ප්‍රධාන ආරාධිත අමුත්තා සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු



# එක්දින භාවනා වැඩසටහනක්





යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් පරිදි මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව දිවයිනේ සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන ආවරණය වන පරිදි ලක්විරු අධ්‍යාත්මික භාවනා වැඩසටහන් පැවැත්වේ. ඒ අනුව එහි තවත් එක් අධියරක් ඉකුත් ජූලි මස 30 දින මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථානයේදී පැවැත්විණ. එහි ආඥාපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ඒඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී මඟපෙන්වීම මත සිදුකෙරුණු එම වැඩසටහන දියසෙන්පුර විමල ස්ථවිරයන් විසින් මෙහෙයවන ලදී. ඒ සඳහා 59, 64, 68 සේනාංක හා ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ට අයත්, බළසේනා මූලස්ථාන සහ ඒකක භට පිරිස් සහභාගි වූහ.









## ඓතිහාසික දිනයක

# අභිමානවත් ඇරඹුමක්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 23 වන යුද්ධ හමුදාධිපති ලෙස ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී 2019 අගෝස්තු මස 21 දින සුබ මොහොතින් සිය තනතුරෙහි රාජකාරී භාරගන්නා ලදී. ඒ නිමිත්තෙන් යුද්ධ හමුදා මූලස්ථානයේ ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් අභිමානවත්ව සංවිධානය කෙරුණු උත්සවයේ විචිත්‍ර මතක සටහන්වලින් මෙම පිටු වර්ණවත් වේ.



















# ගිනි නිවීමේ කටයුතු සඳහා දායක වෙමින්

හොරණ ප්‍රදේශයේ පිහිටි ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්ත ශාලාවක ඉකුත් ජූලි මස 28 දින විදුලි පරිපථයක ඇතිවූ විදුලි කාන්දුවීමක් හේතුවෙන් ගිනි ගැනීමේ තත්ත්වයක් ඇති විය. එම ගින්න මැඩපැවැත්වීම සඳහා බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත එම ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් ජල බවුසර් යොදා ගනිමින් 582 වන බළසේනා මූලස්ථානයේ ක්ෂණික විහිදුම් කණ්ඩයේ භටපිරිස්වල සහ හොරණ ගිනි නිවීමේ ඒකකයේ සහයද ඇතිව ගින්න මැඩපැවැත්වීමට කටයුතු යොදන ලදී.




# "රට වෙනුවෙන් එකට සිටිමු" ජාතික වැඩසටහන

141 බසේමු බළප්‍රදේශයට අයත් 5 විපාරෙ ඒකකයේ භට පිරිස්වල සහභාගීත්වයෙන් ඉකුත් අගෝස්තු මස 03 දින "රට වෙනුවෙන් එකට සිටිමු" ජාතික වැඩසටහනට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයෙහි වතුපිටිවල රෝහල පරිශ්‍රය තුළ ශ්‍රමදාන වැඩසටහනක් සිදුකරන ලදී.





# වැඩමුළුවක්

ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ ඇති සේනාංක මූලස්ථාන, බළසේනා මූලස්ථාන, ඒකක හා පුහුණු පාසල්හි රාජකාරියේ නියුතු නිලධාරීන් සඳහා තම ජීවිතයේ කාර්යක්ෂමව තීරණ ගැනීම පිළිබඳ ඉතා හරවත් වැඩමුළුවක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ ප්‍රධාන දේශන ශාලාවේදී ඉකුත් අගොස්තු මස 02 දින පැවැත්විණ. මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත පැවති එම දේශනය ලුතිනන් කර්නල් (විශ්‍රාමික) වසන්ත පමුනුව යන නිලධාරී විසින් පවත්වන ලදී.





# භෞතික විද්‍යා සම්මන්ත්‍රණයක්




මුලතිව් දිස්ත්‍රික්කයේ මෙවර අපොස (උ/පෙළ) විභාගය සඳහා විද්‍යා අංශයෙන් පෙනී සිටින සිසු සිසුවියන් සඳහා භෞතික විද්‍යා සම්මන්ත්‍රණයක් ඉකුත් ජූලි මස 19 දින මුලතිව් මුල්ලියාවේලි විද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. අදාල දේශනය සඳහා එම බලප්‍රදේශයට අයත් පාසල් හතරකින් සිසු සිසුවියන් 148 දෙනෙකු සහභාගී වූහ. එම අවස්ථාව සඳහා 592 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති කර්නල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයෙන් 59 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. මේ සඳහා ලංකා බැංකුව මුලතිව් මුල්ලියාවේලි ශාඛාව මගින් අනුග්‍රාහකත්වය ලබාදී තිබිණ.

# රණවිරු දෙසුමක්

මහරගම මෘදුකාංග නිෂ්පාදනාගාර E - BEYOND ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ ඉල්ලීමකට අනුව එහි ප්‍රධාන කළමණාකාරීත්වයට හා සහයක කළමණාකකරුවන් හට වත්මන් ආරක්‍ෂක තත්ත්වය, ධනාත්මක ආකල්ප හා නායකත්වය පිළිබඳ වැඩමුලුවක් එම ආයතන ශ්‍රවණාගාරයේදී ඉකුත් අගෝස්තු මස 06 දින පැවැත්විණ. 14 සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීම යටතේ එම සේනාංකයෙහි ප්‍රමානි 1 (සම්බන්ධීකරණ) වශයෙන් කටයුතු කරන ලුතිනන් කර්නල් එම්බීබීඑන් හේරත් ආර්එස්පී විසින් අදාළ දේශනය සිදුකරන ලදී.



# ලේ බිඳක් දන්දෙමින්




මහනුවර ගරු දිසා අධිකරණයේ සුබසාධක සංගමය මගින් සංවිධානය කරනු ලැබූ ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු මස 15 දින එම දිසා අධිකරණ පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම ලේ දන්දීමේ වැඩසටහන සඳහා 11 සේනාංක මූලස්ථානයේ සහ බූවැලිකඩ සංඝා පුහුණු පාසලේ හටපිරිස් සහභාගී වූහ.

# මතක සරදම්...




පඩි දිනයක් වූ බැවින් වෙනදාට වඩා වැඩි තදබදයක් බැංකුව තුළ දිස් වේ. ඔබමොබ යනෙන බොහෝ දෙනෙකු වෙනුවෙන් බැංකුවේ දොර අරින වහන වාර ගණන කොපමණදැයි ජයදේවට සිතා ගැනීමටත් අසීරුය. කෙසේ වුවද සිය වගකීම මොහොතකට අත්නොහැර බැංකුවට ඇතුලු වන පිටවන සෑම අයෙකු පිළිබඳවම සියුම් ලෙස සුපරීක්ෂාකාරී වීමට ඔහු අමතක නොකරයි. වේගයෙන් පැමිණි වාහනයක් බැංකුවේ දොරකඩ නතරවීම ජයදේවගේ දෑඩි විමසිල්ලට බඳුන් විය. කඩිමුඩියේ ඉන් බැස ගත්තේ හමුදා නිලධාරියෙකි. ඔහු සමඟ තවත් හමුදා සාමාජිකයින් දෙදෙනෙකුද එහි වූහ. ජීප් රථයෙන් බැසි හමුදා නිලධාරියා තේජස් ඉරියව්වෙන් බැංකුව වෙත පිය මැන්නේය. දොර අසල රැකවලෙහි හුන් ජයදේව ඒ දෙස බලා සිටියේ මහත් ඕනෑකමිනි. හමුදා නිලධාරියා බැංකුවට ඇතුල්වත්ම ජයදේවට හුනස්නෙන් නැගිටුනේ ඉබේටමය.

"ගුඩ් මෝර්නිං සර්"

ඕනෑවටත් වඩා දොර විවර කරමින් ජයදේව පැවසුවේ ඉමහත් ගෞරවයෙනි. ජයදේවට ප්‍රතිචාර දැක්වූ හමුදා නිලධාරියා කවුන්ටරය වෙත පියමනින ආකාරය ඔහු බලා සිටියේ මහත් උද්දාමයෙනි. ඔහු මිදුලේ සිටි සෙසු හමුදා සාමාජිකයින් පිළිබඳ විපරම් කරන්නට වූයේ තමා දන්නා හඳුනන අයෙකු ඒ අතර සිටීදෝ සැකයෙනි. පෙරදා තමන්ද මේ අයුරින්ම නිල ඇඳුමින් සැරසී සිටි අපූරුව ඔහුට චිත්‍රණය වන්නට විය. එහෙත් තමාට අද බැංකු ආරක්ෂයෙකු ලෙස හිඳිමින් බැංකුවේ දොර අසල දවස ගෙවන්නට සිදුවීම පිළිබඳ ඔහු තුළ වූයේ නොසතුටක් හා පශ්චාත්තාපයකි. එනිසාම බැංකුවට ඇතුල්වන හමුදා සාමාජිකයන්ගෙන් මුහුණ සඟවා ගන්නට ඔහු නිරතුරු වෑයම් කළේය.

"හලෝ බැජී, උඹ මෙහෙ වැඩද?"

කිසිවකු තම උරහිසට තට්ටු කරමින් පැවසූ එවදන් ඇසෙත්ම ජයදේව තිගැස්සී ආපසු හැරුණේය.

"ඇයි බං අඳුරන්නෙ නැතුව වගේ ඉන්නෙ... මම වැලිවේරිය චන්දරේ"

ඔහු ජයදේවගේ අත්දෙකෙන් අල්ලා ගත්තේය.

"අනේ චන්ද්‍රා. මට හිතාගන්නත් බෑ... උඹ කොහෙද මෙහෙ?"

"ඇයි බං මතක නැද්ද මම මේ ළඟනෙ පදිංචි වෙලා හිටියෙ. ඒක නොවෙයි ජයේ උඹ මේ පැත්තෙ නෙවෙයිනෙ ඉස්සර හිටියෙ"

"ඔව් මචං තාම කෑගල්ලෙමයි. මෙහෙ බෝඩ්වෙලා ඉන්නෙ. වැඩිය කෑ ගහන්න එපා. කවුරුවත් දන්නෙ නැහැ මම ආමි හිටිය බව"

"උඹ පුදුම මිනිහෙක්නෙ ජයේ. නොකියම නතර වුනේ ඇයි. බලහං උඹ දූන් ඇඳිල ගිහිං. උඹත් මම වගේ හිටියනම් මෙලහකටත් සාජන් කෙනෙක්. බලහං මම හයිටිත් ගිහිල්ලයි ආවෙ"

"මට උඹ දැක්කම ලෝබයි චන්දරේ. ඒත් දූන් මොනව කරන්නද? මම මුල වරද්ද ගත්තනෙ"

විනාඩි ගණනක කතාබහෙන් අනතුරුව ජයදේවගෙන් සමුගත් චන්දරේ ඉන් ඉවත් වූයේ මැකී ගිය මිතුදම යළි අලුත් කරමිනි. බැංකුවේ දොර අසලට වන් ජයදේව හමුදා වාහනය බැංකුවේ සීමාව පහුකර නොපෙනී යනතෙක්ම බලා සිටියේය.

---

නිවසේ ආලින්දයට වී සතිඅන්ත පුවත්පත පෙරලමින් සිටි ජයදේව එහි සෑම පිටුවක් පුරාම ඉහළ සිට පහළට නෙත් යොමුකරන්ට වූයේ මහත් ඕනෑකමිනි. තම අරමුණ සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් කුමන හෝ හෝඩුවාවක් එහි ඇති බව ඔහුට විශ්වාසය.

"ඔයා ඔය කොයිතරම් දඟලුවත් ආයිත් හමුදාවට බැදෙන්න බැනෙ"

ජයදේව සමීපයට වන් ප්‍රියංවදා නෝක්කාඩු ස්වරයෙන් කීවාය.

"ඔය ඉතිං යමකට අතගහන කොටම ඔයා උදූල්ල දානවා. පොඩ්ඩක් ඉන්නකෝ. මම මොකක් හරි ක්‍රමයක් තියෙනවද කියල බලන්න"

ජයදේව පුවත්පත දෙකට නමා අසලවූ මේසය මත තබන අතරේ පැවසීය.

"ඒ කාලෙ ඔය උනන්දුව තිබ්බනම් අදත් ඔයා හමුදාවෙ. අඩුතරමෙ මේ වෙනකොට පටි දෙක තුනකුත් අඳින්න තිබුනා. කොහෙද ඔයාගෙ පණ්ඩිත වැඩ නිසානෙ සේරම"

"හරි හරි ප්‍රියංවදා දූන් වෙච්ච දේ උනා. ආයිත් ගිය දේවල් කතාකරල වැඩක් නෑනෙ.

"වැඩක් නෑ... මට නම් මතක් වෙනකොටත් කේන්තියි. ඒ දවස්වල ඔයාමනෙ මහ ලොකුවට උඩදාගෙන ගියේ. රට රකින්න ඕන කියලා"

"හරි ඉතිං ඔයා කියන්නෙ මම හිටපු කාලෙ රට රැක්කෙ නෑ කියලද? උතුරු නැගෙනහිරින් පිට අඩියක් තිබ්බද ඒ කාලෙ? අනික ඔපරේෂන් කීයකට නම්

සම්බන්ධ උනාද? සාම්පූර් අල්ලද්දිත් මම හිටිය, වාකරේ අල්ලද්දිත් මම හිටිය, එතකොට තොප්පිගල. ඊටත් කලින් තව...

"හා හා ඇති ඇති. නවත්තගන්ඩ. මොනව කරත් අන්තිමට අයින්වෙන කොට හුලං. පෙන්ෂන් එකක් තියෙනව කියලයැ. දැන් බලන්න ඔයා මේ වෙනකල් හිටියනම් කොයිතරම් ඉහළට යන්න තිබුණද?"

ඇය දිග සුසුමක් පිට කරමින් පැවසුවාය.

"ඉස්සර හමුදාවෙ ඉන්න කාලෙ ඔයා ගමේ මොනතරම් වීරයෙක් වගේද හැසිරුණේ"

"හරි හරි ප්‍රියංවදා මම යුද්දෙට බයේ හැංගුනේ නැනෙ. අන්තිම කොටියත් වලපල්ලට යවලයි පස්ස බැලුවෙ.

"හපොයි ඒක මම නොදන්නවයැ. එහෙමනම් මොන එහෙකටද පස්සෙ යන්න බෑ කිව්වෙ"

"රට නිදහස් කරගත්තට පස්සෙ හමුදාවෙ ඉඳල තේරුමක් නැනෙ. ඒකයි මම යන්න බෑ කිව්වෙ"

"එහෙමනම් ඔයා ගෞරවාන්විත විදිහට අයින්වෙන්න එපායැ"

"ඇයි මම එහෙම නෙමේද නතර වුනේ"

"අපොයි ඔව් ගෞරාන්විතව. අන්තිමේදී තිබුන පටියත් ගැලවිලා ගියා. මාස ගණන් ඇබ්සන්ට් ගස්ස ගෙන හැංගි හැංගි මොන නාඩගමක්ද නැටුවෙ. අර පොදු සමාවට ගිහිං බාරවුනේ නැත්නම් මෙලහකට ඔයා හිරේ. අපේ අයියට පින්සිද්ද වෙන්න යන්තම් ඔයා ගැලවිලා ආව"

"හරි හරි ඒ සේරම ඇත්ත. මම ඒව තේරුම් ගත්ත හින්දනෙ ආයිත්

**"හරි ඉතිං ඔයා කියන්නෙ මම හිටපු කාලෙ රට රැක්කෙ නෑ කියලද? උතුරු නැගෙනහිරින් පිට අඩියක් තිබ්බද ඒ කාලෙ? අනික ඔපරේෂන් කීයකට නම් සම්බන්ධ උනාද? සාම්පූර් අල්ලද්දිත් මම හිටිය, වාකරේ අල්ලද්දිත් හිටිය. එතකොට තොප්පිගල. ඊටත් කලින් තව..."**

**"හා හා ඇති. ඇති. නවත්තගන්ඩ. මොනව කරත් අන්තිමට අයින්වෙන කොට හුලං."**

යන්න හිතුවෙ"

"මේ මොන විකාරයක්ද, ආයිත් හමුදාවට යන්න"

"ඔව්. ඇයි නරකද?"

"එකපාරක් එපාවෙලා ආපු කෙනා ආයිත් යන්න හදන්නෙ ඇයි?"

"රට බේරගත්තට මදිනෙ ප්‍රියංවදා. රට ගොඩනඟන වැඩේටත් උදව් කරන්න එපායැ"

"ඒක ඔයාට හිතන්න තිබුනෙ කලින්නෙ. එහෙමනම් අර පොදු සමාවට බාරවුනු වෙලාවෙ ඔයාට දිගටම ඉන්න තිබුනනෙ. ඇයි අපේ අයියට පිංසෙන්ඩු වෙලා අයින්වුනේ"

"ගිය දේවල් දැන් කතා කරල වැඩක් නැනෙ ප්‍රියංවදා. ප්‍රමාද වෙලා හරි මම ගත්ත තීරණේ වැරදිද කියන්නකෝ ?"

"වැරැද්දක් නෑ. ඒත් අයෙත් එහෙම බැඳෙන්න පුලුවන්ද ?"

"ඒකට ඔයාලගෙ අයියගෙන් පොඩි ශපෝට් එකක් ගනිමු. එයා ඉන්නෙත් ආමි හෙඩ්ක්වාටර්ස්වලනෙ. අනික එයාගෙ පෝස්ට් එකේ හැටියට මේ වැඩේ කරල දෙන්න බැරි නැනෙ"

"අනේ මට නම් බෑ ආයෙත් අයියට කරදර කරන්න. අනික මට කටක් ඇරල කියන්න පුලුවන්ද ඔයා ගැන"

ඔන්න ඔන්න එයා බොරුවට ඩිමාන්ඩ් කරන්ඩ එපා. තමුන්ගෙ ස්වාමියාගේ සාධාරණ ඉල්ලීමක් වෙනුවෙන් තමන්ගෙ අයියට කතා කරන්න බැරිකමක් නැනෙ ඔයාට"

දිගින් දිගමට කරන ජයදේවගේ ඇවිටිලි නොරිස්සූ ප්‍රියංවදා කෝපයෙන් යුතුව ඉන් ඉවත් වූවාය.

තමා අතීතයේ කළ මෝඩකම් ගැන ජයදේව කල්පනා කරන්නට විය. එදවස දුරදිග නොබලා වැරදි තීරණ නොගන්නට තමාට අදත් වීරෝදාර රණවිරුවෙකු ලෙස ගෞරවණීයව කල් ගෙවන්නට තිබුණා නොවේදැයි ඔහුට සිතිණ. සතියට දින හයක් උදේ සිට සවස් වනතුරුම බැංකුවේ දොර අසල රාජකාරිය ඔහුට දැනටමත් එපාවී ඇති සෙයකි. එහෙත් රැකියාවක් නොකර නිවසට වී සිටීම යනු සියතින්ම දිවිනසා ගැනීමක් බව ඔහු දනී.

........................................................................

"ලොකු අයියට මේව කොහොම කියන්නද මන්ද. ඒත් මම මේවා වෙන කාට කියන්නද?"

ප්‍රියංවදා සිය වැඩිමහලු සොහොයුරාගේ නිවසේ ආලින්දයේ වූ පුටුවකට බරවී කතාවට මුලපිරුවාය.

"ඇයි නංගී ජයදේව ආයිත් මොනවා හරි ප්‍රශ්නයක් දාගෙනද?"

"ප්‍රශ්නයක්මත් නෙමෙයි අයියේ එයාට ආයෙමත් හමුදාවට යන්න ඕනෙලු"

"මොකක්.... මිනිහට මොලේ හොඳ නැද්ද?"

"අනේ මන්ද අයියෙ. හැමදාම පත්තරේ දිගඇරගෙන හමුදාවට කට්ටියට බඳවගන්න දැන්වීම් බලබලා මට කරදර කරනවා. ඔයාට කියන්නලු"

"නංගි කියපු නිසානෙ ඔය මිනිහව මම දාල දුන්නෙ. එහෙම කරලත් ගිය දවසේ ඉඳන් ප්‍රශ්න. ට්‍රේනින් එකේදී පැනලා එන්න හැදුවේ යන්තම් කියලා කියලා නවත්තගත්තා. පාස්අවුට් උනාට පස්සේ මම ඉන්න රෙජිමේන්තුවටම දාල දුන්නා. හොඳ තැනකට ට්‍රාන්සර් එකක් හදලා දුන්නා. මම මොනවද ඔය මිනිහ වෙනුවෙන් නොකලෙ"

"හරි හරි අයියෙ මං දන්නවා. මං ඒවා නෑ කිව්වද? තව වයසත් තියෙන හින්දා හිටපු තැනටම හදාගන්න බැරිද කියලයි ජයදේව අහන්නේ"

"ඔයාට පිස්සුද නංගී. හිතුන හිතුන වෙලාවට යන්න එන්න මේක ගාමන්ට් එකක් නෙවෙයි"

"අයිය කියන දේවල් මටත් නොතේරෙනවා නෙමෙයි. ඒත් මනුස්සයාගෙන් බේරිල්ලක් නෑ. කරදර කරනවා."

"මටත් ආත්මගරුත්වයක් තියෙනවනෙ නංගි. හමුදාවෙන් අයින් වුන කෙනෙක් ආපහු ගන්න මම කොහොමද මැදිහත් වෙන්නේ. දැන් කාලේ මාස 06 ක් ඇබ්සන්ට් වෙලා හිටියත් අයින් කරලා දානවා ඉස්සරවගේ නෙමෙයි. දැන් නිතී තදයි. මටත් කරන්න පුලුවන් සීමාවක් තියෙනවනේ. ඇයි දැන් ඔය බැංකුවේ රස්සාව එපා වෙලාද?"

"එපා වෙලා නෙවෙයි. ඒත් නිතරම බැංකුවට හමුදාවේ අය යන එන හින්දා ඒ අය දැකලා ආයිත් බැඳෙන්න උනන්දුව වැඩිවෙලා"

"ජයදේව ගැන මටත් කණගාටුයි නංගි. ඒ උනාට මේ දේවල් මිනිහ විහින් කරගත්ත ඒවනෙ." සිය සහෝදරයාගේ පැහැදිලි කිරීම් ඉතා සාධාරණ බව ප්‍රියංවදා දනී. තවදුරටත් ඔහුට ඇවිටිලි කිරීම නොකල යුත්තක් බැව් ඈට හැඟිණ. ඕ ඉන් පිටවූයේ තම ස්වාමියා පිළිබඳ වූ කෝපය මුසු වේදනාවක් ද සමඟිනි.

........................................................................

"ආ ප්‍රියංවදා, කොහොමද කාලෙකින් මේ පැත්තෙ"

"හලෝ නයනා... මම මේ අයියලගෙ දිහා ගියගමන්, ළඟ නිසා මේ පාරෙන් හැරුනා."

"ඉතිං අයියා ගෙදර හිටියද"?

"ඔව් ඔව් එයා කොළඹ ඉන්න නිසා සතිඅන්තෙ ගෙදරනෙ"

"අයිය නම් දැන් ලොක්කෙක් නේද? ළඟදි දවසක අපිටත් ටවුමෙදි හම්බ වුණා. අපරාදෙ කියන්න බෑ ප්‍රියංවදා අයියා ඉහළට යන්න යන්න නිහතමානියි. ඉස්සර වගේම දැක්ක තැන කතාකරල යන්නෙ."

**"අපොයි ඔව් ගෞරවාන්විතව. අන්තිමේදී තිබුණ පටියත් ගැලවිලා ගියා. මාස ගණන් ඇබිසන්ට් ගස්ස ගෙන හැංගි හැංගි මොන නාඩගමක්ද නැටුවෙ. අර පොදු සමාවට ගිහිං බාරවුනේ නැත්නම් මෙලහකට ඔයා හිරේ. අපේ අයියට පින්සිද්ද වෙන්න යන්තම් ඔයා ගැලවිලා ආව"**

"අයිය ඉතිං කවදත් එහෙමනෙ නයනා"
"ඒක නෙමෙයි හස්බන් ආයිත් වැඩට යනවද ?"
"නෑ නයනා... එයා අර බැංකුවේ සිකියුරිටි එකේනෙ"
"ඒ උනාට අපරදෙ බං ජොබ් එක. උඹ දන්නවද දූන් හමුදාවෙ අයට පඩි හොඳයි. ඉස්සරහට බේසික් එකත් වැඩිවෙනව කියල අපේ එක්කෙනා කිව්වා. අනික පහසුකම් උනත් බලපංකො. හස්බන්ට මේ ළඟදි සුවසහනෙන් ලක්ෂ පහලොවක ලෝන් එකකුත් හම්බ උණා.."
නයනා උජාරුවෙන් පවසද්දී ප්‍රියංවදාගේ මුහුණ මැලවී ගියේය.
"අනේ කොච්චර දෙයක්ද නයන. අපිට කොයින්ද ඒ වගේ වාසනාවක්"
"ඇයි ප්‍රියංවදා හස්බන් ඔයතරම් වේලාසනින් අයින් වුනේ. මොකෝ යුද්දෙට බයේද?"
ඈ සිනාසෙමින් කීවාය.
"යුද්දෙ ඉවර වෙලා කොච්චර කල්ද නයනා. එහෙම බයකට නෙමෙයි. හරියටම මටත් හේතුව කිව්වෙ නැහැ. කොහොම වුනත් එයාට බැරිනම් මම බලෙන් යවන්නද? අපෙත් අවාසනාව...."
ප්‍රියංවදා දිගු සුසුමක්ද පිට කරමින් කීවාය.
තම ස්වාමියාගේ රැකියාව සම්බන්ධ ගැටලුවේදී වැඩිපුරම පීඩනය එල්ලවන්නේ තමාට නොවේදැයි ඈට සිතුණි. එහෙත් සියල්ලට මුහුණදීම හැර විකල්පයක් නොමැති බැව් ඈ අවබෝධ කොට ගත්තාය.

..............................................................

සුපුරුදු ලෙසම බැංකුවේ දොර අසල සිය රාජකාරිය ඇරඹී ජයදේව තුළ දිස්වූයේ වෙනදාට වඩා ව්‍යාකූල බවකි. ක්‍රමයෙන් හුරුපුරුදු ගණුදෙණුකරුවන් ගෙන් බැංකුව පිරී යන්නට විය. එදින යුද හමුදාවේ පඩි දිනයක් වූ බැවින්දෝ හමුදා සාමාජිකයින් කිහිපදෙනෙකු බැංකුවට පිවිසෙනු පෙනිණි. ඔවුනගේ මුහුණු උද්දාමයෙන් පිරී ඇත. ජයදේවගෙන් අවධානය නිරතුරු එදෙස එල්ල වුවද ඔවුන්ගේ නෙතු නොගැටෙන්නට ඔහු වගබලා ගත්තේය. සිය බිරිඳගේ වදන් ඔහුගේ සිත තුළ නැවත නැවත රැව්පිලිරැව් දෙන්නට විය.

"හමුදාව කියන්නෙ මහ පුදුම තැනක් ජයේ. අවුරුදු හත අටක් ඉඳලත් ඔයාට ඒක තේරුම් ගන්න බැරි වුනානෙ. සමහරුන්ට ඉන්නකල් හමුදාවෙ වටිනාකමක් තේරෙන්නෙ නෑ. ඔයාටත් වුනේ ඒකයි. හමුදාවෙ ඉන්නත් වාසනා කරන්න ඕන. අනිත රණවිරුවෙක් වෙන්න හැමෝටම බෑ ජයදේව."

කල්පනාබරිත වූ ජයදේවගේ සිත නොදැනුවත්වම බොහෝ දුර ගොස්ය. හෙතෙම සාක්කුවේ වූ මුදල් පසුම්බිය අතට ගෙන ඉන් කිසිවක් ඉවතට ගත්තේය. පෙරදා යුද හමුදා සේවයේ යෙදී සිටියදී ගන්නා ලද නිල ඇඳුමින් සැරසී ඔහුගේ උඩුකය සහිත ඡායාරූපයක් එහි විය. තේජස රැඳි එම ඡායාරූපය දෙස ඔහු ඇසිපිය නොහෙලා මොහොතක් බලා හිඳ දිගු සුසුමක් හෙලුවේය. හදිසියේම යමක් මතක් වූ අයකු මෙන් ඔහු එය සාක්කුවේ රුවා ගත්තේ බැංකුවට ඇතුලුවන ගණුදෙණුකරුවන් අතරේ විශේෂ අයෙකු දුටු හෙයිනි. ඔහු කඩිනමින් දොර පළුවක් විවර කළේය.
"ගුඩ් මෝනිං සර්"

නිමි.

**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**

# නව නිපැයුම් ප්‍රදර්ශනය 2019





යුද්ධ හමුදාධිපති තුමන්ගේ සංකල්පයකට අනුව යුද්ධ හමුදා සාමාජිකයින්ගේ හැකියාවන් එළිදැක්වෙන "නව නිපැයුම්" තරඟාවලියක් සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන ආවරණය වන පරිදි පවත්වන ලදී. මේ යටතේ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හිදීද එම තරඟාවලියක් පැවැත්විණ. එහි ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩීයූ ගේ උපදෙස් හා මගපෙන්වීම මත සංවිධානය කෙරුණු එම නව නිපැයුම් ප්‍රදර්ශනය ඉකුත් අගෝස්තු මස 23 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ ටෝච් සිනමා ශාලාවේදී පවත්වන ලදී. මෙහි සමාරම්භක උත්සවය ආසේමු (මධ්‍යම) බ්‍රිගේඩියර් (ප්‍රමාණි) බ්‍රිගේඩියර් එස්එම්එස්පීබී සමරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ අතර, මෙම ප්‍රදර්ශනය සඳහා සේනාංක/බළසේනා/ඒකක/පුහුණු පාසල් නියෝජනය කරමින් නව නිපැයුම් 31 ඉදිරිපත් කර තිබුණි. එම නිර්මාණ අතර, මෙවර යුද්ධ හමුදා විද්‍යා පීඨයේ පාඨමාලා හදාරන කෙඩෙට් නිලධාරීන් විසින් නව නිපැයුම් 12 ක් ඉදිරිපත් කිරීමද විශේෂයකි.

මෙහි හොඳම නව නිපැයුම් විනිශ්චය කිරීම හා එම නිර්මාණවල ගුණාත්මකභාවය සොයා බැලීම සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඩීආර්පීපී කාලිදාස, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්ටීසීඅයි විමලදාස සහ පර්යේෂණ විශ්ලේෂණ ශාඛාවේ ලුතිනන් කර්නල් ගුණසේන යන අයවලුන් විසින් සිදුකරන ලදී. එහිදී ඉතා අඩු වියදමකින් හා පහසුවෙන් ගොඩනැගිලි, වාහන ආදියෙහි තීන්ත ආලේප කිරීමට සුදුසු යන්ත්‍රයක් නිර්මාණය කළ සෙ/එස්105811 ඉසෙ කුමාර ඩීඑස් - 10(සෙව්) ඉසේරෙ එම තරඟාවලියෙහි ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදී.

# විජයබාහු මොටෝක්‍රොස් - 2019



ශ්‍රී ලංකා යුද්ධ හමුදා විජයබාහු පාබල රෙජිමේන්තුව මගින් සංවිධානය කරනු ලැබූ දිවයිනේ විශිෂ්ටතම යතුරු පැදි ධාවන තරඟාවලියක් වන විජයබාහු මොටෝක්‍රොස් තරඟාවලිය ඉකුත් අගෝස්තු 25 දින කුරුණෑගල බෝයගනේ විජයබාහු මොටෝක්‍රොස් ධාවන පථයේදී අති උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී. විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති සහ ප්‍රවර්ධන ප්‍රගමන මධ්‍යස්ථානයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඑම්ඩීසීඩී ගුණවර්ධන ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් මෙම තරඟාවලියට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය. තවද ඊට විශේෂ ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී ද එක්විය.

තරඟකරුවන් 125 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් 17 වන වරටත් පවත්වන ලද මෙම තරඟාවලියට දිවයින පුරා විසිරුණු ප්‍රසිද්ධ යතුරු පැදි ධාවන තරඟකරුවන් වන ඉෂාන් දසනායක, ඉවෝන් වී ගුරුසිංහ, සමීර ප්‍රේමරත්න, නිහාල් විජේරත්න, ලහිරු ජීවන්ත, මධුර පීරිස්, ජැක්ස් ගුණවර්ධන මෙන්ම ඉන්දියාව, ජපානය, තායිලන්තය ආදී රටවල් නියෝජනය කරමින් ජාත්‍යන්තර තරඟකරුවන් රැසක්ද ඊට සහභාගී වූහ. අති ප්‍රවේගකාරී ක්‍රීඩාශීලීත්වයක් පෙන්නූ මෙවර තරඟාවලිය එහි පැමිණි යතුරුපැදි ධාවන තරඟ ලෝලීන් අමන්දානන්දයට පත් කිරීමට සමත්විය.

මෙවර මොටෝක්‍රොස් තරඟාවලිය විවිධ කාණ්ඩ යටතේ යතුරු පැදි ධාවන ඉසව් 13 කින් සමන්විත විය. එහිදී යුද්ධ හමුදාධිපති කුසලානය ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කරමින් මධුර පීරිස් විසින් දිනාගත් අතර, ජපන් ජාතික ක්‍රීඩකයා රෙජිමේන්තු අධිපති කුසලානය දිනාගනිමින් තරඟාවලියේ ශූරයා බවට පත්විය. වසරේ නැගී එන යතුරුපැදි ධාවකයා කුසලානය කේසර ගොඩගේ විසින් දිනාගත් අතර, තරඟාවලියේ දිගම පිම්ම සඳහා වන කුසලානය විනුෂ්ක ත්‍රිමල්ෂ සිල්වා විසින් හිමිකරගන්නා ලදී.

කුරිරු ත්‍රස්තවාදීන් හමුවේ අභීතව සටන් වැද ජාතිය වෙනුවෙන් දිවිපිදූ රණක්ෂිතයට පත් සහ සේවයේ යෙදී සිටින රෙජිමේන්තු සාමාජිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුබසාධනය පිණිස අරමුදල් රැස්කිරීම මෙම තරඟාවලිය පැවැත්වීමේ අරමුණයි.



# 30 වන ඒකක සංවත්සර සැමරුම





5 (සෙව්) බළඇණිය ගජබා රෙජිමේන්තුවට ඉකුත් ජුලි මස 07 දිනට වසර 30 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලද අතර, එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් කේකේ ජයසිංහ ගේ ප්‍රධානත්වයෙන් හොරොව්පතාන පිහිටි බළඇණි පසුමුලයේදී පැවති සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව හා ස්වාමීන් වහන්සේලා 30 නමක් විෂයෙහි පැවති දානමය පිංකම ප්‍රධාන විය. තවද ඒකක අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීමද, සියලු නිල දිවා භෝජන සංග්‍රහයද විචිත්‍රවත්ව පැවති සංගීත ප්‍රසංගයද සංවත්සර දින වර්ණවත් කෙරුණු වැඩසටහන් අතර විය.

## අභිමානවත් 32 වන සංවත්සරය සමරමින්



1987 අගෝස්තු මස 10 දින කොන්ඩුවටුවාන යුද්ධ හමුදා කඳවුරේදී ආරම්භ කරන ලද 6 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව එහි 32 අභිමානවත් සංවත්සරය ඉකුත් අගෝස්තු මස 10 දින විශ්වමඩු යුද්ධ හමුදා කඳවුරේදී අතිඋත්කර්ෂවත්ව සමරන ලදී. මෙම බළඇණි සංවත්සර දිනයේදී විශේෂ සිදුවීමක් ලෙස ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී ධූරය හෙබවූ (විශ්‍රාමික මේජර් ජෙනරාල් ඒජී වීරසේකර) වර්තමනයේ අම්පාර බුද්ධංගල ආරණ්‍ය සේනාසනයේ වැඩවාසී බුද්ධංගල ආනන්ද හිමිපාණන් වහන්සේ වැඩමවා සියලු නිලයින් උදෙසා බෝධිපූජා පිංකමක් සහ ධර්ම දේශනාවක් පවත්වන්නට යෙදුණි.

## 11 වන සංවත්සර දිනය අභිමානවත්ව සමරයි

වව්නියාව දිස්ත්‍රික්කයේ කනගරායාන්කුලම් කරප්පුකුට්ටි හි ස්ථාපිත 16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ඉකුත් ජුලි මස 28 දින සිය 11 වන සංවත්සරය ඒකක අණදෙන නිලධාරී මේජර් ඒඒඩීඑස් ඉන්දුකගේ ප්‍රධානත්වයෙන් ආගමික වතාවත්වලට ප්‍රමුඛත්වය දෙමින් පැවැත්විණ. එහිදී පැවති සියලු නිල දිවා භෝජනයද ත්‍යාග හා සහතික ප්‍රදානෝත්සවයද සංගීත ප්‍රසංගයද සංවත්සර වැඩසටහන් අතර කැපී පෙනුණි.



# දෙවිසි වසක අභිමානය





22 සේනාංකයෙහි අභිමානවත් 22 සංවත්සරය ඉකුත් ජූලි මස 23 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජ්එන්එම් වීරසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීමෙන් උත්සව කටයුතු රැසක් පවත්වන ලදී. එහිදී සියලු රණවිරුවන්ට සෙත් පතා බෝධිපූජා පිංකමක් පැවැත්වීම, ත්‍රිකුණාමලය රේවත ළමා නිවාසය සඳහා රාත්‍රී ආහාර වේලක් ලබාදීම හා එහි දූ දරුවන් වෙත ත්‍යාග ලබාදීම ප්‍රධාන විය. තවද සේනාංකාධිපතිතුමන් වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීමද, සියලු නිලයින් සඳහා දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීමද සන්ධ්‍යාවෙහි පැවති සංගීත ප්‍රසංගයද දෙවිසි වසරක අභිමානවත් දින උත්සව අතර කැපී පෙණුනි.

# පුරෝගාමී බළකායට වසර 60 ක් සපිරේ





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පැරණිතම ඒකකයක් වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකාය සිය 60 වන සංවත්සරය අභිමානවත් ලෙස ඉකුත් ජූලි මස 05 දින සැමරීය. එහිදී ඒකක අණදෙන නිලධාරී කර්නල් ඩීඑල්ඩීඩී ජයසූරිය ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් මාලාවක් පවත්වන ලද අතර එහිදී ඒකක අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාලියක් පිරිනැමීම, රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පූද කිරීම, දිවිපිදූ රණවිරුවන් ගේ පවුල්වලට වියළි ආහාර පාර්සල් බෙදාදීම මූලික විය.

# දස වසක අභිමන් සමරා





23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 10 වන සංවත්සරය ඉකුත් අගෝස්තු 01 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් අණදෙන නිලධාරී මේජර් ඒඑම්එම්පීකේ මැදගෙදර ආර්එස්පී ගේ උපදෙස් මත වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී අණදෙන නිලධාරී වෙත කඳවුරු මුරයක් හා සම්මාන ආචාර පෙළපාලියක් පිරිනැමීමත්, ක්‍රීඩා තරඟ හා සියලු නිල දිවාභෝජන සංග්‍රහයක් පැවැත්වීමත් සුවිශේෂී විය.

# සංචාරයක සටහන්





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පසුගිය දා එම බලප්‍රදේශයේ ස්ථාපිත 61 සහ 54 සේනාංකයන්හි සංචාරයක නිරත විය. එහිදී එම සේනාංකවල රාජකාරි කටයුතු පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි හට පිරිස් හා කතාබහ කිරීමටද අමතක නොකළේය.

# යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුබසාධනය උදෙසා පහසුකම් රැසක්





21 වන සේනාංකය සහ 212 බලසේනා මූලස්ථානය වෙත අඩුපාඩුවක්ව පැවති නිලධාරි හා සෙසුනිලයන්ගේ සුබසාධනය සඳහා වන පහසුකම් සංකීර්ණයක් ඉකුත් ජූලි 28 දිනට යෙදුණු සුබ මොහොතින් 21 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්පීඑන්කේ ජයපතිරණ ආර්එස්පී ගේ සුරතින් විවෘත කෙරිණ. කරණවැමිහල, රූපලාවන්‍යාගාරය, මැහුම්හල, සපත්තේරුහල හා පුස්තකාලයකින් සමන්විත වූ මෙම පහසුකම් සංකීර්ණය සේනාංකාධිපතිගේ අදහසකට අනුව 212 බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්පී ළමාහේවා යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණයෙන් ඉදිවිය.

# මීමැසි ව්‍යාපෘතියක්

කිළිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී ගේ මඟපෙන්වීම මත කිළිනොච්චිය ප්‍රදේශයේ සිවිල් වැසියන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් මේ වන විට විවිධ ස්වයං රැකියා හඳුන්වාදී ඇත. ඒ අනුව මීමැසි පාලනය පිළිබඳ දැනුම ඉහළ නැංවීම සඳහා වූ දෙදින වැඩමුළුවක් ඉකුත් දා පැවැත්විණ. වාරියපොල කෘෂිකර්ම පාසලේදී පැවැත්වූ එම වැඩමුළුව 65 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව් කුමාරප්පෙරුම යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ සිදුකළ අතර ඊට 57, 65 හා 66 සේනාංකයන්හි යුද්ධ හමුදා සාමාජිකයින් පිරිසක්ද සහභාගී වූහ.





# අකුරු කරන්නට රණවිරු අතහිත





ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් ප්‍රමානි බ්‍රිගේඩියර් ටීඩී වීරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පීගේ සම්බන්ධීකරණයෙන් 681 වන බළසේනාවට අයත් 14 වන විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් අම්පලාවන්පොක්කනෙයි කලෙවානෙ ප්‍රදේශයේ පෙර පාසල් දරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා එළිමහන් ක්‍රීඩා ස්ථානයක් සාදා නිමකර දෙන ලදී. ඉකුත් අගෝස්තු 06 දින එය දූ දරුවන් වෙනුවෙන් විවෘත කරන ලද අතර, එමගින් එහි ඉගෙනුම ලබන දරුවන් හට එතෙක් පැවති විශාල අඩුපාඩුවක් සම්පූර්ණ විය.

# අන්තර් ශ්‍රීලසසබ ඒකක කබඩි ශූරයෝ



අන්තර් ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා ඒකක කබඩි තරඟාවලිය ඉතා උත්කර්ෂවත් අන්දමින් ඉකුත් ජූනි මස 27 හා 28 යන දෙදින පුරා 5 වන විමර්ශන රෙජිමේන්තුව ස්ථාපිත පාන්ගොල්ල අයන්සයිඩ් කඳවුරු ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. එහිදී අවසන් තරඟය සඳහා 5 වන විමර්ශන රෙජිමේන්තුව හා 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා කණ්ඩායම සුදුසුකම් ලැබූ අතර, තියුණු තරඟයකින් අනතුරුව 5 වන විමර්ශන රෙජිමේන්තු කණ්ඩායම ශූරතාව දිනාගැනීමට සමත් වූහ. ජයග්‍රාහී කණ්ඩායමට හිමි ශූරතාව තරඟාවලියේ අවසන් දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි 5 වන විමර්ශන රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්ජ්අයිඑස් මැන්දිස් ආර්එස්පී යූඑස්පී අතින් සිදුවිය.

# විරු දෑතින් සුව සෙවණක්





16 වන (සෙව්) බලඇණිය ශ්‍රීලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී මේජර් යූආර්එල් පෙරේරා ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම ඒකකයේ ශ්‍රම දායකත්වයෙන් දෙමසකදී වැඩ නිමකරන ලද නව නිවසක් ඉකුත් ජූලි මස 13 දින සුබ මොහොතින් පේදුරුතුඩුව කට්කෝවලම් ගම්මානයේ පදිංචි කේ. නට්කුන කුමාරි යනඅය වෙත භාරදෙන ලදී. යාපනය ආරක්ෂක සේනා ආඥාපතිගේ උදාර සංකල්පයක් මත ක්‍රියාත්මක කෙරුණු එම මාහැඟි කටයුත්තට කුමා වීරසූරිය යන අය සහ ඔහුගේ සමීපතම හිතෛෂීන්ගේ මූල්‍ය අනුග්‍රහය හිමිවූහ.




# ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකාය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකායේ වර්තමාන ජ්‍යෙෂ්ඨ නිලධාරී බ්‍රිගේඩියර් ටීටීපී සිල්වා



ඒකක අණදෙන නිලධාරී කර්නල් ඩීඑල්ඩීඩී ජයසූරිය

1959 වසරේ දිවයිනේ පැවති මහා වැඩවර්ජනය හේතුවෙන් සිවිල් පරිපාලනය බෙහෙවින් අකර්මන්‍ය වූ අතර, එම වකවානුව තුළ රටේ නීතිය හා සාමය නිසි පරිදි පවත්වාගෙන යාමට මෙන්ම රටේ අත්‍යාවශ්‍ය රාජකාරි පවත්වාගෙන යාම සඳහා ශ්‍රම බළකායක් අවශ්‍ය වූයෙන් එම තත්වය සමනය කිරීමේ ඵලදායි විසඳුමක් ලෙස වර්ෂ 1959 ක් වූ ජූලි මස 05 වන දින "ශ්‍රමය ජාතියක ජීවයයි" යන ආදර්ශ පාඨය පෙරදැරිව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකාය බිහිවිය. ප්‍රථමයෙන් සෙබලු 14,000 ක පමණ වාර්තාගත හටපිරිසක් මෙම බළකායට ඇතුළත් වූ අතර, ඔවුන් යුද්ධ හමුදා බළකායක් වශයෙන් රටේ සංවර්ධන කටයුතුවලට සහය වෙමින් මාතෘ භූමිය වෙනුවෙන් උදාර මෙහෙවරක් ඉටුකරනු ලැබූහ. මේ වන විට නිලධාරීන් 45 දෙනෙකු හා එක් නිලධාරිණියකගෙන් ද, සෙසු නිලයින් 1015 ක් හා සිවිල් හමුදාගත සෙබළ/සෙබළියන් 245 දෙනෙකුගෙන් සමන්විත මෙම බළකායේ වත්මන් අණදෙන නිලධාරි ලෙස කර්නල් ඩීඑල්ඩීඩී ජයසූරිය ක්‍රියා කරනු ලබයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් පාලන බ්‍රිගේඩියර් ටීටීපී සිල්වා මෙම බළකායේ වත්මන් ජ්‍යෙෂ්ඨතම නිලධාරී වේ.

පරිපාලන කටයුතු පිළිබඳව ප්‍රශස්ත මට්ටමක් ළඟාකර ඇති මෙම බළකාය 1984 වර්ෂයේ දී අන්තර් රෙජිමේන්තු ඒකක පරිපාලන කටයුතු සඳහා ප්‍රදානය කරනු ලබන කුසලතා අභියෝගය දෙවන ස්ථානයත්, 1986 වර්ෂයේ දී අන්තර් රෙජිමේන්තු ඒකක පරිපාලන කටයුතු සඳහා ප්‍රදානය කරනු ලැබූ කුසලතා අභියෝගය දෙවන ස්ථානය හා 1987 වර්ෂයේ දී එහි ප්‍රථම ස්ථානය ද හිමිකර ගනිමින් ප්‍රවීණත්වය හා ප්‍රශස්ත බව මනාව විදහා දක්වා ඇත. තවද ස්වේච්ඡා ඒකකවල පාලන කටයුතු වෙනුවෙන් පිරිනමන ශ්‍රීමත් ජෝන් කොතලාවල අභියෝගතා කුසලානය 1988 වසරේ දී ද මෙම ඒකකය විසින් දිනාගැනීම විශේෂත්වයකි.

**"වර්ෂ 1959 ක් වූ ජූලි මස 05 වන දින "ශ්‍රමය ජාතියක ජීවයයි" යන ආදර්ශ පාඨය පෙරදැරි කරගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමි බළකාය ආරම්භ විය. ප්‍රථමයෙන් සෙබලුන් 14,000 ක පමණ වාර්තාගත හටපිරිසක් මෙම බළකායට ඇතුලත් වූ අතර, ඔවුන් යුද්ධ හමුදා බළකායක් වශයෙන් රටේ සංවර්ධන කටයුතුවලට සහය වෙමින් මාතෘ භූමිය වෙනුවෙන් උදාර මෙහෙවරක් ඉටුකරනු ලැබ ඇත."**

මීට අමතරව බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහල, පනාගොඩ යුදධ හමුදා බෝධිරාජාරාමය, යුද්ධ හමුදා රෝහල යනාදියෙහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පූර්ණ වශයෙන් මෙම බළකායේ ශ්‍රම දායකත්වය ලබා දී ඇත. එමෙන්ම දැනට බත්තරමුල්ල ප්‍රදේශයේ ඉදිකෙරෙමින් පවතින නව ත්‍රිවිධ හමුදා මූලස්ථානය ඉදිකිරීම් කටයුතු සඳහා ද සෘජු දායකත්වය ලබාදීම යනාදිය තුළින් මෙම බළකායේ හට පිරිස්වල අසීමිත කැපවීම පිළිබඳ කදිමට සාක්ෂි දරයි.

කොළඹ තුරඟ තරඟ පිටියෙන් ආරම්භ කෙරුණු පුරෝගාමී බළකාය කටුබැද්ද, මැලේ වීදිය, රත්මලාන, තෙලවල, වව්නියාව - වෙප්පම්කුලම, පැලවත්ත, බත්තරමුල්ල වැනි ක්‍රියාත්විත හා ක්‍රියාත්විත නොවන ප්‍රදේශයන්හි විවිධ රාජකාරි කටයුතු ඉටුකරන ලදී. එදාමෙදාතුර තරුණ නිලධාරීන් සහ විශාල සෙබළ පිරිසක් උතුරු - නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්විත හා පාලන රාජකාරීන්හි මෙන්ම පුහුණු මධ්‍යස්ථාන/පාසල්, බුද්ධි බළකාය, විශේෂ බළකාය, කමාන්ඩෝ බළකාය වැනි ස්ථානවලත් ඇතැම් මූලස්ථානවලත් රාජකාරීන්හි නිරතව සිටිති. වර්ෂ 2016.02.16 දින රෙජිමේන්තුවක් හා ස්වේච්ඡා ඒකක 02 ක් වශයෙන් ප්‍රතිසංවිධානය වුවද යුද්ධ හමුදා සංස්ථා යථායෝග්‍ය ප්‍රමාණකරණය යටතේ නැවතත් තනි බළකායක් වශයෙන් මතුගම පැලවත්ත ප්‍රදේශයේ 2018.10.18 දින සිට පුරෝගාමී බළකා මූලස්ථානය ස්ථාපිත කරන ලදී. මෙම බළකාය මගින් 1980 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ආධුනික සෙබලුන් පුහුණු කිරීමේ ස්වේච්ඡා ආධුනික පුහුණු පාසලක් ද පවත්වා ගෙන ගොස් ඇත.

1981 ඔක්තෝබර් 16 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයේ ප්‍රථමවරට ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව මියගිය සෙ/8232 ලා/කෝ තිසේරා එච්එම් යන වීරෝදාර රණවිරුවා මෙම බළකායට අයත් සොල්දාදුවෙකි. එතැන් සිට දශක 03 ක් පුරා පැවති ඊළාම් යුද්ධයේ දී අප මාතෘභූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය රැකගැනීමට සක්‍රීය දායකත්වය ලබාදෙමින් බළකායට අයත් නිලධාරියෙකු හා සෙසුනිලයින් 69 දෙනෙකු ජීවිත දානය පුදකර ඇති අතර, නිලධාරින් 03 දෙනෙකු සහ සෙසු නිලයින් 18 දෙනෙකු යුදබිමේ දී තුවාල ලබා ඇත.

පුරෝගාමී බළකාය ක්‍රීඩා සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වලදීද විවිධ දක්ෂතා දැක්වූ අවස්ථා රැසක් ඇත. ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ රැසක් හිමිකර ගැනීමට මෙම බලකායේ සෙබලුන් සමත් වූ අතර බිලියඩ් හා ස්නූකර්, ජූඩෝ ආදී තරඟ ඒ අතරින් කිහිපයකි. 1988 වසරේ දී අන්තර් ඒකක බිලියඩ් හා ස්නූකර් ශූරතාව දිනා ගැනීම ඉන් එක් ජයග්‍රහණයකි. මෙම බළකායට අයත් ක්‍රීඩකයෙක් මෙම වසරේ ඉන්දියාවේ පැවති 2019 පොදු රාජ්‍ය මණ්ඩලීය ජූඩෝ තරඟාවලියේ කි.ග්‍රෑ 81 ට අඩු බර පන්තියෙන් රිදී පදක්කම දිනා ගැනීමට සමත්වීම මෑතක දී ලැබූ තවත් එක් ජාත්‍යන්තර ජයග්‍රහණයකි.

පසුගිය ජූලි මස 05 වන දින අභිමානවත් වූ බළකා දින 60 වන සංවත්සරය සමරන ලද අතර, රට දැය උදෙසා ජන සෙත නැගුමට උරදෙමින් තවදුරටත් ශ්‍රී ලංකාද්වීපයේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී ක්‍රියා කිරීම යුද්ධ හමුදා පුරෝගාමි බළකායේ ඒකායන අරමුණ බව මෙහිදී මහත් අභිමානයෙන් සඳහන් කළ යුතුව ඇත.

*ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකාය*

# VISION ENGLISH LESSON SPECTRUM

## ( "දැක්ම" ඉංග්‍රීසි පාඩම් මාලාව)




***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රිසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

### *Be + About to*

යම්කිසි කාර්යයක් පිළිබඳ විස්තර කිරීමේදී "**කරන්නයි ඉන්නේ**" ආදී වශයෙන් අදහස් ප්‍රකාශ කිරීමේදී මෙම වාක්‍ය රටාව භාවිතා වේ.

Formula - සූත්‍රය

| |
|---|
| **Subject + Be + About to + Verb (infinitive) + Object + Rest.** |
| සබ්ජෙක්ට් + බි + එබවුට් ටු + වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්. |
| කර්තෘ+ උපකාරක ක්‍රියා පද + කරන්නයි ඉන්නේ + ක්‍රියා පදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය |

Ex/උදා :-

1. He is about to build a new house.
   හී ඉස් එබවුට් ටු බිල්ඩ් අ නිව් හවුස්.
   ඔහු අලුත් නිවසක් හදන්නයි ඉන්නේ.

2. They are about to play cricket.
   දේ ආ එබවුට් ටු ප්ලේ ක්‍රිකට්.
   ඔවුන් ක්‍රිකට් සෙල්ලම් කරන්නයි ඉන්නේ.

3. We are about to sing song.
   වී ආ එබවුට් ටු සින්ග් සෝන්ග්.
   අපි සිංදු කියන්නයි ඉන්නේ.

Nota Bene/සැ:යු :-

ඉහත වාක්‍යයෙහි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,

- Subject :- කර්තෘ පදය ඒකවචන හා බහුවචන රූප උපකාරක ක්‍රියා පද සමඟ ව්‍යාකරණානුකූලව භාවිතා වේ.
- Am/Is/Are :- උපකාරක ක්‍රියාපද ලෙස භාවිතා වේ.
- About to :- "කරන්නයි ඉන්නේ" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.
- Verb :- ක්‍රියාපදය වාක්‍යයේ භාවිතා කිරීමේදී Infinitive ක්‍රියා මූල පදයක් ලෙස භාවිතා කළ යුතුය.
- Object :- කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන භේදයකින් තොරව භාවිතා වේ.
- Rest :- ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

| |
|---|
| Analysis of the Sentence Formation - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය. |
| **Subject + Be + About to + Verb (Infinitive) + Object + Rest.** |
| සබ්ජෙක්ට් + බී + එබවුට් ටු + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්. |
| කර්තෘ + උපකාරක ක්‍රියා පද + කරන්නයි ඉන්නේ + ක්‍රියාපදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය. |
| I am about to buy a car.<br>අයි ඈම් එබවුට් ටු බයි අ කාර්.<br>මම මෝටර් රථයක් ගන්නයි ඉන්නේ. |

***English vision*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



කපිතාන් චමින්ද ලියනගේ - ශ්‍රීලයුපොදුසේබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk




# ජීවිත සාර්ථකත්වය

## ජීවිතය සැලසුම් කිරීමේදී...

ලෝකයට පොදු ධර්මතා පිළිබඳව මනා අවබෝධයකින් එය කළ යුතුය. මක්නිසාදයත් එවැනි ධර්මතාවලට එකඟ නොවන කිසිවක් මේ මහපොළොව මත සැබෑවක් බවට පත්කළ නොහැකි බැවිනි. එබැවින් ජීවිතයේ ඉක්මන් සහ නිවැරදි සාර්ථකත්වයක් සඳහා කළයුතු වන්නේ ඔබේ පරමාර්ථ ඔබ සඳහා සැකසී ඇති විශ්ව සැලැස්මට අනුකූලවන ලෙස සකසා ගැනීමයි. එබැවින් ජීවත් වීමට ඇති කාලයෙන් අපටත් මේ විශ්වයටත් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන අයුරින් ජීවත් වී මෙලොවින් සමුගත යුතුය. ජීවිතය, ඔබට ලැබුන වටිනාම අවස්ථාවකි. ඉන් වැඩක් ගන්න. එම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ගන්න. ජීවිතයෙන් ඔබට කළහැකි උපරිමය කරන්න. වියහැකි විශිෂ්ඨතම පුද්ගලයා බවට පත්වන්න.

## ලෝකාවබෝධය...

ජීවිතයේ සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා මුලින්ම කළයුතු වන්නේ ලෝදහමේ සැලැස්ම ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි අවබෝධකොට ගැනීමත්, ඔබේ ජීවිත අපේක්ෂාවන් සහ අරමුණු ලෝක යථාර්ථයන්ට අනුකූලවන පරිදි ගළපා ගැනීමත්ය.

## මතක තබාගන්න......

සොබාදහමට නිශ්චිත සැලැස්මක් සහ පරමාර්ථ තිබේ. අපට මුළු ජීවිත කාලය පුරා මුහණපෑමට සිදුවනුයේ එම සොබාදහමේ සංසිද්ධීන්වලටය. සොබාදහම අපගේ පෞද්ගලික මතිමතාන්තර හෝ තර්ක පිළිනොගනියි. එබැවින් ජීවිතයෙන් ඔබට ලැබෙනුයේ ඔබ බලාපොරොත්තුවන දේවල් නොව,සොබාදහමට අනුව සිදුවිය හැකි දේවල්ය. සොබා දහම ඔබට වාසි සහගත ලෙස හෝ පක්ෂපාතීව කටයුතු කරනු ඇතැයි කිසිවිටෙක බලාපොරොත්තු නොවන්න.

## ඕනෑම පුද්ගලයෙකු හට සිදුවී ඇති සිදුවීමක් අපටද සිදුවීමට ඉඩඇත...

මෙලොව ජීවත් වීමේදී ලෝක ධර්මතා වලට අනුව වෙනත් ඕනෑම පුද්ගලයෙකු හට සිදුවී ඇති සිදුවීමක් අපටද සිදුවීමට ඉඩඇත. එවැනි ඕනෑම අසුබවාදී සිදුවීමකදී ඒවාට සුබවාදීව මුහුණදීමත් උපේක්ෂා සහගත වීමත් කළ යුතුවේ. අප ජීවිතයේ ඇතැම් ප්‍රශ්න සහගත තත්වයන්ට මුහුණ දුන්විට නිතරම අපේ සිතට නැගෙන සිතුවිල්ලක් වන්නේ "සොබා දහම මෙතරම්ම කුරිරුද?" යන්නයි. සොබාදහම අපේ දෘෂ්ඨීන් මත පිහිටා විග්‍රහ කළ නොහැකිය. එය කුරිරු හෝ කාරුණික ද නොවේ. එය හුදෙක් සොබා දහම ම පමණක්ය. අප විසින් කළ යුත්තේ එහි ස්වභාවය තේරුම් ගැනීමය.

**මිනිසුන් ජීවිතය දුෂ්කර යයි පවසද්දී මගේ සිතට නැගෙන ප්‍රධානම ප්‍රශ්නය වන්නේ, ඔවුන් ජීවිතය දුෂ්කර යැයි සිතන්නේ කුමකට සාපේක්ෂවද? යන්නය.**

**-සිඩ්නි.ජේ.හැරිස් - ඇමරිකානු ලේඛක-**

## ජීවිතය අර්බුද වැලකි...

දෛනික ප්‍රශ්න සමූහයකට අමතරව ජීවිතය විශාල සහ කුඩා අර්බුද සමූහයකින් සමන්විත වනු ඇත. ඔබ කුමන තරාතිරමක අයෙකු වුවද සැම දිනයකම අර්බුදයකට මුහුණ දීමට ඔබට සිදුවනු ඇත. ඔබ බලාපොරොත්තුවන ලෙස සිදුවීම් හැමවිටම පෙළ නොගැසේ. අවස්ථා ගණනාවකදී ඔබට පරාජයන් අත්විය හැක. එහෙත් එවැනි පරාජයන් සැබැවින්ම පරාජයන්ද නැත්ද යන්න තීරණය කිරීමට ඉක්මන් නොවන්න. මන්ද එය තීරණය විය යුත්තේ ඒ මොහොත් අප දරන ආකල්පයට අනුව නොව, අපේ ජීවිතයට එම සිදුවීමෙහි ඇති සත්‍ය බලපෑම අනුවය. එසේ වන්නේ විශ්ව බලවේගය සතුව වඩා යහපත් සැලැස්මක් අප විෂයෙහි ක්‍රියාත්මක වීමට නියමිතව ඇති බැවිනි.

එබැවින් කිසිදු අවස්ථාවක කිසිදු සිදුවීමකින් පසු නොබසින්න. අසුබවාදී නොවන්න. ජීවිත සටනින් පරාජය පිළිනොගන්න. මතක තබා ගන්න බොහෝවිට ඔබට දුෂ්කරතා පමුණුවනුයේ ඔබගේ උපරිම සැඟවුණ ශක්තීන් එළියට ගනු පිණිස සියලු දුෂ්කරතා හමුවෙහි අප විසින් කලයුතු වන්නේ වඩාත් ධනාත්මක සහ ධෛර්‍ය සම්පන්න ලෙස ඒවාට මුහුණ දීමත් හැකි අවස්ථාවට අනුව කළහැකි යහපත්ම දේ කිරීමත්ය. ඉතිරිය සිදුවීමට ඉඩහරින්න. එවිට විශ්වීය බලවේග විසින් ඉතිරිය සිදුවිය යුතු හොඳම ආකාරයට විසඳනු ඇත.

ඔබ බලාපොරොත්තුවන ලෙස සිදුවීම් හැමවිටම පෙළ නොගැසේ. ඇතැම්විට ජීවිතය අපට දෛවෝපගත සිදුවීම් වලට මුහුණ පෑමට සලස්වයි. එවැනි වේදනාත්මක අත්දැකීම් මගින් අපට අධ්‍යාත්මික අවබෝධයක් ලබාදීමත් අපගේ ප්‍රඥව ඉහළ මට්ටමකට ඔසවා තැබීමත් සිදුවේ.

එබැවින් එවැනි සිදුවීම් මත අපගේ ජීවිතවල ඉරණම අසුබවාදීව තීරණය වීමට ඉඩ නොතැබිය යුතුවේ.

**ඔබට ජීවිතය දුෂ්කර වී ඇත්නම් ආඩම්බර වන්න! දෙවියන් දුෂ්කරම සටන් පවරන්නේ ශක්තිමත්ම පුද්ගලයින්ටය.**

**- කේට් හූබර්ට් -**

**දෙවියන් අතැම්විට ආශිර්වාද ලද්දවුන් දූර්පරීක්ෂාවට භාජනය කරනු ලබත්.** මෙය ක්‍රිස්තියානි සංකල්පයකි. මෙහි අදහස වන්නේ ජීවිතයේ කිසියම් සාර්ථකත්වයක් ලැබීමට පෙර විඳදරාගත යුතු වන වේදනාවන් ප්‍රමාණයක්ද ඇති බවය. ජීවිත ගමන වඩා වටින්නේ අභියෝගයන් අතරින් ඉදිරියට යද්දීය. ඇතැම් විට ඔබගේ සතුරා ඔබගේ මිතුරාට වඩා වැදගත් පාඩම් ඔබට උගන්වයි. ජීවිතය දුෂ්කරය එහෙත්, ඊට මුහුණදීමට තරම් ඔබ ශක්තිමත්ය. එමෙන්ම ජීවිතය කටුක වීමටද ඉඩ ඇත. එවිට ඔබ ඊටත් වඩා ශක්තිවන්ත විය යුතුය.

## අපට මෙම ජීවිතය ලැබී ඇත්තේ කුමක් සඳහාද....?

අපට මෙම ජීවිතය ලැබී ඇත්තේ කුමක් සඳහාද? යන්න පැහැදිළි කර ගැනීමෙන් පමණක් මීට පිළිතුරු සපයාගත හැකිය. අපට මෙම ජීවිතය ලැබී ඇත්තේ, ජීවිත කාලය පුරා විවිධ අත්දැකීම්වලට මුහුණපෑමට සැලැස්වීමෙන් මනා ජීවිත අත්දැකීම්වලින් සපිරි ඉහළ අධ්‍යාත්මික අවබෝධයක් සහිත අධ්‍යාත්මික පරිනතභාවයක් ලබාදීමටය. ජීවිතය සිදුවීම් වැලක එකතුවක් බවත් එහි ප්‍රත්‍යය පරමාර්ථය වී ඇත්තේ විවිධ අත්දූකීම්වලට මුහුණ පෑමට සැලැස්වීම මගින් අපට පාඩම් උගන්වා අපගේ අධ්‍යාත්මය දිනෙන් දින ඉහළට ඔසවාතැබීම බවත් අවබෝධකොට ගන්න.

එබැවින් දෛනික ප්‍රශ්නවලට අමතරව දිනපතාම විශාල සහ කුඩා අර්බුද ගණනාවකට මුහුණදීමට ජීවිත කාලය පුරාම අප හට විටින් විට සිදුවනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස අප බලාපොරොත්තුවන පරිදිම සිදුවීම් පෙළ නොගැසීමට ඉඩ ඇත. මේ හේතුවෙන් ජීවිතය දුක, සැප සහ ජය පරාජය යන සියල්ලෙහිම එකතුවක් බවට පත්වනු ඇත. ජීවිත ගමන වඩාත්ම සාර්ථක වනුයේ අභියෝග සහ වැටීම් අතරින් ඉදිරියට යද්දීය.

## ජීවිතය දුක, සැප සහ ජය පරාජය යන සියල්ලෙහිම එකතුවකි...

අප තේරුම් ගත යුත්තේ අපගේ ජීවිත කාලය පුරාම විවිධ හේතූන් නිසා ඇතිවන දුක හා දොම්නස් ස්වභාවයට අපට මුහුණ දීමට සිදුවන බවකි. එය ඉතා සාමාන්‍ය තත්වයකි. එමෙන්ම එය සොබා දහමෙහි ධර්මතාවයයි. එම තත්වය මැනවින් අවබෝධ කොටගෙන එයට සාර්ථකව මුහුණදී ජීවිත පරමාර්ථ ජය ගැනීම විනා, එවන් දුක්ඛදායී අත්දූකීම් හමුවෙහි ජීවිතයෙන් පැරද පලායාම මිනිසුන් වන අපගේ වගකීම නොවන්නේය.

**"මිනිසුන් ඔවුන්ගේ අවශ්‍යතා පරිදි සියල්ල සැලසුම් කළද ඒ සියල්ල එලෙසින්ම වන්නේ නැත. දෙවියන් ඒ සියලූ සැලසුම් වෙනස් කරයි."**

## ජීවත් වීමෙහි ප්‍රධාන පරමාර්ථය වනුයේ...

ජීවිතයේදී අපට මුහණදීමට සිදුවන සිදුවීම් සියල්ල ධනාත්මකව භාර ගැනීමටත් විශේෂ වර්ගීකරණයකින් තොරව ඒවා සමග සාර්ථක ලෙස කටයුතු කිරීමටත් ඒ හරහා සැබෑ ලෙස ජීවිතය අවබෝධකොට ගැනීමටත් කටයුතු කිරීම ජීවත්වීමෙහි ප්‍රධාන පරමාර්ථය වේ. එබැවින් අප විසින් කළයුතු වන්නේ ජීවිතය යථාර්ථවාදීව අවබෝධ කොටගැනීමත් එම අවබෝධය මත පදනම් වෙමින් වඩාත් සාර්ථක ලෙස ජීවිත අභියෝග ජය ගැනීමත්ය.

ජීවිතයේ ප්‍රධාන වගකීම වනුයේ ජීවිතය විඳදරා ගැනීමය. පිළියම් කළ නොහැකි වේදනාවන් විඳදරා ගන්න. මිනිසුන් වන අපට විවිධ වූ වේදනාවන්, දුක් සන්තාපයන්, අපහසුතාවයන්, දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවේ. ඒවා පාලනය කළ නොහැකි නම් එඩිතරව එම තත්වයන්ට මුහුණ දීමට සහ විඳදරා ගැනීමට සිත එකඟ කර ගන්න. එම තත්වයන්ට ප්‍රමෝදයෙන් මුහුණදීමට සිත දියුණු කර ගන්න. සියලු දුෂ්කරතා හමුවෙහි අප විසින් කළයුතු වන්නේ වඩාත් ධනාත්මක සහ ධෛර්‍ය සම්පන්න ලෙස ඒවාට මුහුණ දීමත් හැකි උපරිම හොඳින් අවස්තාවට කළහැකි දේ කිරීමත්ය. ඉතිරිය සිදුවීමට ඉඩහරින්න. එවිට විශ්වීය බලවේග විසින් ඉතිරිය සිදුවිය යුතු හොඳම ආකාරයට විසඳනු ඇත.

අප මේ ලෝකයට පැමිණ සිටිනුයේ ඉතාමත් කෙටි කාලයකටය. කිසිදු අනතුරු හැඟවීමකින් හෝ පෙර දැනුම් දීමකින් තොරව මේ ජීවිතය හැර යාමට අපට සිදුවනු ඇත. ඕනෑම මොහොතක ඔබ සතු සියල්ල ඔබට අහිමි විය හැකිය. එපමණක් නොව ඔබේ ජීවිතයද අහිමි විය හැකිය. ඒ බව දැනගෙන ජීවත් වන්න. එබැවින් එම කෙටි කාලසීමාව උපරිමයෙන් සාර්ථක කර ගැනීමටත් උපරිමයෙන් විඳීමටත් කටයුතු කළ යුතුය. ඔබට හැකි උපරිමයෙන් කරුණාවන්ත පුද්ගලයෙකු වන්න. හදවතට එකඟව, අවංක සහ සත්‍යවාදී අයෙකු වන්න. ඔබට උරුම වී ඇති ජීවිතයෙන් කළ හැකි උපරිමය කරන්න.

ජීවිතය තිලිණයකි - එයින් උපරිම ඵලය ලබන්න
ජීවිතය සුන්දරය - එය අගයන්න
ජීවිතය සිහිනයකි - එය සැබෑවක් කර ගන්න
ජීවිතය අභියෝගයකි - එයට මුහුණ දෙන්න
ජීවිතය පැවරුමකි - එය සම්පූර්ණ කරන්න
ජීවිතය පොරොන්දුවකි - එය ඉටු කරන්න
ජීවිතය ගීතයකි - එය ගයන්න
ජීවිතය අරගලයකි - එය ජය ගන්න
ජීවිතය දුකකි - එය විඳදරා ගන්න
ජීවිතය ඛේදන්තයකි - එය සතුටින් බාර ගන්න
ජීවිතය වීර වික්‍රමයකි - එයට අභියෝග කරන්න
ජීවිතය අතිශයින්ම විරල වස්තුවකි - එය දිවි පරදුවට තබා සුරකින්න
ජීවිතය ජීවිතයම වේ- සුභවාදීව ජීවිත සටනෙහි යෙදෙන්න

*ලුතිනන් කර්නල් චන්න කරුණාරත්න ආර්එස්පී (විශ්‍රාමික)*
*ජීවිත මාර්ගෝපදේශන උපදේශක*

# අභිමංසල 3 සුවසහන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගියදා අභිමංසල 3 සුවසහන මධ්‍යස්ථානයේ සංචාරයක නිතර විය. එහිදී රණක්ෂිතයට පත් රණවිරුවන් සමග තේපැන් සංග්‍රහයකටද සහභාගී වූ හෙතෙම ඔවුන් සමග සුහද පිළිසඳරක නිරතවීමටද අමතක නොකළේය.



# සාමූහික පුහුණුවක්





ඉකුත් ජූලි මස 24 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකායේ නිලධාරී පුහුණුවීම් දිනය එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. බළකාධිපති මේජර් ජෙනරාල් එස්එච් මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී ගේ උපදෙස් මත මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීජී හේවගේ ආර්එස්පී ගේ මෙහෙයවීමෙන් පැවති එම පුහුණුවීම් අවස්ථාව සඳහා එම රෙජිමේන්තුවට අයත් ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ නිලධාරීන් 80 දෙනෙකු සහභාගී වූහ.









හතරවන වියට පා තබන
**ජීබී හිරුසි නිසංසලා ගුණසේකර දියණියට**
සුබ උපන්දිනයකට
ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/425474 ලා/කෝ ගුණසේකර ජීබීපී)

හත්වන වියට පා තබන
**පුනිදි උපුන්‍යා නෙත්සරණී චන්ද්‍රපාල දියණියට**
සුබ උපන්දිනයකට
ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/829188 ලා/කෝ ධනුෂ්ක කුමාර එච්පී)

තුන්වන වියට පා තබන
**කේඑම් රශ්මික හේෂාන් පුතුට**
සහ පළමුවන වියට පා තබන
**කේඑම් තරුල්‍යා මෙත්සරණී දියණියට**
සුබ උපන්දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/525858 ලා/කෝ ජයතිලක කේඑම්පීඑම්)



ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල් අයිඕඩබ්ලිව් මාදොල**
2019 අගෝස්තු මස 08 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ලෙස
**මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී**
2019 අගෝස්තු මස 20 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති ලෙස
**බ්‍රිගේඩියර් ආර්එල්සී ප්‍රනාන්දු ඒඩීසී**
2019 අගෝස්තු මස 15 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස
**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එස් ආරියසිංහ ආර්එස්පී**
2019 ජූලි මස 04 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස
**බ්‍රිගේඩියර් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
2019 අගෝස්තු මස 05 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ලෙස
**බ්‍රිගේඩියර් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
2019 අගෝස්තු මස 15 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස
**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්පීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී**
2019 අගෝස්තු මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බ්‍රිගේඩියර් පාලන/භකාස ලෙස
**කර්නල් ජේබී රන්දෙනිය**
2019 ජූලි මස 31 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



122 වන බළසේනාවේ බළසේනාධිපති ලෙස
**කර්නල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**
2019 අගෝස්තු මස 13 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



212 වන බළසේනාවේ බළසේනාධිපති ලෙස
**කර්නල් පීඒච්එම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
2019 අගෝස්තු මස 15 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චිය) කර්නල් ප්‍රධාන මාණ්ඩලික ලෙස
**ලුතිනන් කර්නල් කේඑච්එන්පී හැන්නදිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**
2019 ජූලි මස 22 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) කර්නල් ප්‍රමාණි ලෙස
**ලුතිනන් කර්නල් එස්ඒඑස්යූකේබී සේනානායක**
2019 ජූලි මස 18 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



යුද්ධ හමුදා මූලස්ථානයේ
මූලස්ථාන බළඇණියේ
අණදෙන නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**එච්පීඅයි පෙරේරා ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී**
2019 අගෝස්තු මස 28 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) කර්නල් ප්‍රධාන
මාණ්ඩලික නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**ජීබීඩබ්ලිව්එම්ආර්කේආර්**
**බංඩාර ආර්ඩබ්ලිව්පී එල්එස්සී**
2019 අගෝස්තු මස 12 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



14 වන සේනාංකයේ
කර්නල් ප්‍රමානි ලෙස
**ලුතිනන් කර්නල්**
**ඒවල් මාපලගම**
2019 අගෝස්තු මස 29 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



61 සේනාංකයේ ප්‍රධාන
මාණ්ඩලික I (ක්‍රියාත්මක) ලෙස
**ලුතිනන් කර්නල්**
**එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
2019 අගෝස්තු මස 22 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලයේ
ප්‍රමානි I ලෙස
**ලුතිනන් කර්නල්**
**එස්ජේ කාරියකරවන**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
2019 අගෝස්තු මස 26 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



අභිමංසල III
සුවසහන මධ්‍යස්ථානයේ
සේනාවිධායක ලෙස
**ලුතිනන් කර්නල්**
**පීඒ නන්දතිලක ආර්එස්පී යූඑස්පී**
2019 ජූලි මස 01 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



11 වන ශ්‍රී ලංකා
කාලතුවක්කු හමුදාවේ
අණදෙන නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**ඒඑම්ඩබ්ලිව්ඩී අබේසිංහ ආර්එස්පී**
**යූඑස්පී අයිජී**
2019 අගෝස්තු මස 15 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



11 වන කාරක ඉංජිනේරු
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**ජේඒසීඑස් ජාගොඩ පීඑස්සී**
2019 ජූලි මස 02 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



6 වන බළඇණිය
ශ්‍රී ලංකා පාබල හමුදාවේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**එම්ඒපී පෙරේරා**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**
2019 මැයි මස 20 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



17(සේවා) බළඇණිය ගජබා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**ඩබ්ලිව්පීටීඑස් කුසුම්සිරි**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
2019 අගෝස්තු මස 20 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු




7 වන බළඇණිය විජයබාහු
පාබල රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**එස්එස් වීරවික්‍රම**
**ආර්එස්පී**
2019 මැයි මස 10 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු



5 වන ශ්‍රී ලංකා විදුලි හා
යාන්ත්‍රික ඉංජිනේරු බළකායේ
අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**ජීඅයිකේ ජයවික්‍රම**
**පීඑස්සී එල්එස්සී**
2019 අගෝස්තු මස 16 දින
සුබ මොහොතින් රාජකාරි
ආරම්භ කළ අයුරු

### රණවිරුවාට ලිපි නිර්මාණ එවීමේදී

# මේ ගැන සැලකිලිමත් වන්න



"රණවිරුවා " යුද්ධ හමුදාවේ ප්‍රකාශනයක් බැවින් ඔබ එවන ලිපි නිර්මාණ ඊට ගැලපෙන ඒවා විය යුතුය. විශේෂයෙන්ම යුද්ධ හමුදාවේ ප්‍රතිරූපයට හානිවන හෝ සෙබලුන්ගේ චිත්ත ධෛර්ය බිඳවැටෙන නිර්මාණ නොවිය යුතුය.

## කවි නිසඳැස්...

සඳැස් කවි නම් උපරිමය පැදි අටකට සීමා කරන්න. නිසඳැස් නම් උපරිමය පේළි 10 - 15 කට සීමා කරන්න.

## විශේෂාංග ලිපි...

උපරිමය තනි පැත්තේ ලියන ලද **A.4** ප්‍රමාණයේ පිටු දෙකකට සීමා කරන්න. (නිර්මාණයේ ගුණාත්මක භාවය සළකාබලා අමතර ඉඩකඩ වෙන් කිරීම සිදුකෙරේ)

## ඒකක තොරතුරු...

සංක්ෂිප්ත කර අදාළ තොරතුරු පමණක් එවීමට කටයුතු කරන්න. ඊට සම්බන්ධ ඡායාරූප එවීමේදී සිදුවීමට අදාලව වැඩිදෙනෙකු නියෝජනය වන පැහැදිලි ඡායාරූප එවීමට වගබලා ගන්න.(එකම පුද්ගලයන්ගේ ඡායාරූප පමණක් එවීමෙන් වළකින්න)

## ඡායාරූප එවීමේදී...

ඡායාරූ **JPGE** ලෙස එවීමට කටයුතු කළ යුතු අතර, උදාහරණ : **Excel, Power Point** හා **Word** යන මෘදුකාංග තුළ ඡායාරූප ඇතුලත් කර එවීමෙන් වළකින්න. තවද ජංගම දුරකථන මගින් ගනු ලැබූ ඡායාරූප එවීමේදී එහි ගුණාත්මක භාවය කෙරෙහිද සැලකිලිමත් වියයුතු අතර, එසේ ලබාගන්නා ඡායාරූප වැඩි ධාරිතාවකින් යුත් ඡායාරූප විය යුතුය.

සියලුම ඡායාරූප **JPGE** ලෙස **(Resolation 300)** හා අකුරු **(Font Size - 12) FM/DL** වලින් පමණක් එවන්න (උදාහරණ **(FM Abhaya, FM Emani)**. තවද ඉස්කෝල පොත, **Kandy** හෝ **Sandya Boy** වර්ගයේ **Fonts** භාවිතා නොකරන්න.

## ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



**අධීක්ෂණය**
බ්‍රිගේඩියර් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී



**උපදේශකත්වය**
ලුතිනන් කර්නල් එස්ජේ කාරියකරවන
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී - විපාරෙ



**ප්‍රධාන සංස්කාරක**
මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ - ශ්‍රීලයුපොදුසේව



**සහාය සංස්කාරක**
කපිතාන ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ



**සෝදුපත් කියවීම**
කපිතාන ඩීඑම් දිලහාරා සජීවනී - ජාඕබ

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 කෝප්‍රල සේනාරත්න පීසී - 3 ඉසේරෙ
සෙ/753797 ලාන්ස් කෝප්‍රල කුමාරසිංහ එම්ජීඑම් - 11 ඉසෙරෙ
සෙ/2081045 ඉසෙ ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉසෙරෙ

## රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුහමු උතුරු පර්ෂදය
නුවරපාර, දළුගම, කැලණිය.

**ඊමේල්**
dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන - 011 2993076
යුහ දිගුව - 55162/55163

# හදවතින් බර දැරූ උත්තම මිනිසුන්

බර දරන එක අමාරුයි.
ඒ වගේම බර දරාගෙන
ඇවිදින එක ඊටත් වඩා අමාරුයි.
ඇඟපතේ සවිශක්තිය තියෙන
ඕන කෙනෙකුට ඒ දේවල් කරන්න
පුලුවන්. නමුත් බෝම්බ වෙඩි මැද්දෙ,
මඩ ගොහොරු, ලඳුකැළෑ මැදින්
කකුල් එරෙන වැලි පොළොවෙ ඇවිදින
එක හැමෝටම කරන්න බෑ.

සාමාන්‍යයෙන් ඕනෑම කෙනෙකුට බරක්
දැනෙන්නෙ අත් කකුල්වලට.
එහෙම නැත්නම් උරහිසට පිටට.
නමුත් මේ සේරටම වඩා රණවිරුවන්ට
බර දැනුණෙ හදවතට.
ඒ වෙන කිසිවක් නිසා නෙවෙයි.
මේ රට ත්‍රස්තවාදයෙන් මුදාගැනීමේ
වගකීම පැවරී තිබුණේ ඔවුන්ට බව
ඔවුන් හොඳින් අවබෝධ කොටගෙන
තිබූ නිසයි. ඒ වගේම ඒ අවදානම,
ඒ කැපවීම රණවිරුවෙකුට හැර
වෙන කිසි කෙනෙකුට කරන්න
බැරි බවත් ඔවුන් දැනගෙන හිටියා.

-සුචින්-

රණබිමේ මතක



දශක 03 ක් තිස්සේ මෙරට වෙළාගෙන තිබූ ත්‍රස්තවාදය සහමුලින්ම අවසන් කර මේ වන විට දස වසක් ඉක්ම ගොස්ය. ගෙවුණු එකී කාලසීමාව තුළ යුද්ධය පිළිබඳ කිසිදු කතාබහක් හෝ මතකයක් සමාජය තුළ මතුව නොතිබුණේ සාමයේ අගය හා නිදහසේ වටිනාකම කොතරම් දැයි සමස්ත ජනතාවම අත්විඳින නිසාවෙනි. නමුත් රණවිරුවන්ගේ අප්‍රතිහත ධෛර්යය හා කැපකිරීම නොවන්නට සාමය හා නිදහස යන්න වචනවලට පමණක් සීමා වූ දෙයක් වන්නට ඉඩ තිබුණි. ඒ නිසාම ඔවුන් එදවස යුදබිම තුළ සිදුකළ මානුෂීය මෙහෙවර පිළිබඳ තතු විත්ති වත්මන් පරපුරට දැන කියා ගන්නට ඉඩ හැරීම අනිවාර්ය අවශ්‍යතාවක් සේම එය ඔවුන් වෙත කෙරෙන උපහාරයක් ලෙසද සැළකිය හැකිය. මෙවරද රණවිරුවා පසුකවරය වෙන් කෙරෙනුයේ එවන් විරුවන්ට උත්තමාචාරයක් ලෙසිනි.